වෙළුම 21 අංක 1 ISSN 1391 - 0299

# විදුරාව

ජාතික විද්‍යා පදනමේ විද්‍යා සගරාව

## විද්‍යා සන්නිවේදනය










VIDUS - 21 - 1

# විදුරාව

වෙළුම 21 කලාපය 1

විද්‍යා සන්නිවේදනය

අර්ධ වාර්ෂික සඟරාව

දෙසැම්බර් 2002

සංස්කාරක සටහන

3 - සමාජ අධ්‍යාපනය සඳහා කාර්යක්ෂම සංනිවේදනයේ මූලධර්ම
මහාචාර්ය එම්.ටී.එම්. ජිෆ්රි

6 - විද්‍යා සන්නිවේදනයේ මුහුණුවර
පර්සි ජයමාන්න

10 - විද්‍යා සන්නිවේදනයේදී යොදා ගන්නා භාෂාව
ආචාර්ය උපාලි ඇම්. සේනානායක

12 - නාට්‍යානුසාරයෙන් විද්‍යා සන්නිවේදනය
සී. වරකාදෙණිය

15 - පොදු ජනතාව වෙත සෞඛ්‍ය සංනිවේදනය
තුසිත මලලසේකර

17 - විද්‍යා සන්නිවේදනය පිළිබඳ සඟරා
ආචාර්ය ඩබ්ලිව්.ආර්. බ්‍රෙකෙන්රිජ්

19 - ජාතික විද්‍යා පදනමේ "සෙවිල්ල" රූපවාහිනී සඟරාව

20 - යුනෙස්කෝ සාමය සහ සංවර්ධනය සඳහා වූ ජගත් විද්‍යා දිනය
සම්මන්ත්‍රණය සහ පුවත්පත් සාකච්ඡාව

සංස්කාරක උපදේශක මණ්ඩලය

මහාචාර්ය එම්.ටී.එම්.ජිෆ්රි
ආචාර්ය ජීවන්ති අමරසිංහ
එල්.එච්. විජේසිංහ
ආචාර්ය ආර්. සුදර්ශන්
ආචාර්ය යූ.එම්. සේනානායක
ආචාර්ය ජයන්ත වත්තෙවිදනගේ
ආචාර්ය වයි.එල්.එච්. යකඳවල
එන්.අයි.එන්.එස්. නඩරාසා
පද්මිණී රණවීර
සුගත් වටගෙදර

සංස්කරණය
ක.ග.ජ. කරුණාසේන

අකුරු සැකසුම සහ පිටු නිර්මාණය
එස්.එච්. ඩබ්ලිව් ද සිල්වා

පිටකවර නිර්මාණය
ක.ග.ජ. කරුණාසේන

මුද්‍රණය
එන්.එස්.එෆ්. මුද්‍රණාලය

ප්‍රකාශනය
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07.

ටෙලි : 696771-3
ෆැක්ස් : 694754
ඉලෙක්ට්‍රොනික තැපැල (E-mail) janak @ nsf.ac.lk

විදුරාව විද්‍යාවේ සිත්ගත්, මාතෘකා සම්බන්ධ නව තොරතුරු ප්‍රචාරණය අරමුණු කර ප්‍රකාශනය කරනු ලබයි.

VIDUS21-1-2

# විද්‍යා සන්නිවේදනය

විශේෂයෙන් ද්‍රව්‍ය, ජීවිතය සහ ස්වාභාවික නීති පිළිබඳ කටයුතු කිරීමේදී සංවිධිත වූ හැදෑරීම සහ ක්‍රම වේදයක් අවශ්‍ය වන දැනුම් ශාඛාවක් ලෙස විද්‍යාව හැඳින්විය හැක. මනුෂ්‍යයාගේ ජීවන තත්වය ඉහළ දැමීම සඳහා මෙම සංවිධිත වූ දැනුම විවිධ මාර්ග ඔස්සේ භාවිතා කෙරේ. මිලියන හයදහසකට එනම් බිලියන හයකට වඩා වැඩි මිනිසුන් ප්‍රමාණයක් අද මිහිමත ජීවත් වේ. එනමුදු, ඔවුහු එක සමාන ලෙස ජීවිත රස විඳින්නේ නැත. කුසගින්න, මන්ද පෝෂණය, ලෙඩරෝග, යනාදිය ද, ජලගැලීම්, ගිනිකඳු, පිපිරීම්, නියං යනාදී ස්වාභාවික විපත්ද, මිනිසා විසින්ම නිර්මාණය කරනු ලැබූ ගැටළු වන සිවිල් යුද්ධ, ත්‍රස්තවාදය යනාදිය ද මිනිසුන්ගේ ජීවිතය මෙලෙස එක සමාන ලෙස රස විඳීමට ඉඩකඩ ලබා නොදේ.

විද්‍යාත්මක දැනුම යොදා ගැනීම මගින් විසඳලිය හැකි ගැටළු රාශියකි. තවමත් විසඳී නොමැති ගැටළු විසඳලීමට විද්‍යාව උපයෝගී කර ගත හැකිය. හොඳම නිදසුන වන්නේ ඒඩ්ස් රෝගයයි. මේ මිහිමත ඒඩ්ස් රෝගයෙන් පෙළෙන මිනිසුන් ගණන මිලියන 40 කට වඩා වැඩිය. විවිධ රටවල විද්‍යාඥයෝ මෙම මාරාන්තික තත්වයට පිළියම් සෙවීම සඳහා අඛණ්ඩව පර්යේෂණ වල නිරතව සිටිති.

සංවර්ධනයේ මට්ටම පිළිබිඹු කිරීම සඳහා නොයෙකුත් දර්ශක යොදා ගනී. දළ ජාතික නිෂ්පාදනය, ජීවිතාපේක්ෂාව, වැඩිහිටි සාක්ෂරතාවය, ළදරු මරණ අනුපාතිකය, මාතෘ මරණ අනුපාතිකය යනාදිය සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා දර්ශක සමහරෙකි. වඩා දියුණු රටවල මෙම දර්ශක මගින් කියා පාන්නේ හිතකර අගයන් වන අතර දුගී රටවල් වල තත්වය ඊට වෙනස් ආකාරයකින් ප්‍රකාශ වේ. වඩා යහපත් ප්‍රතිඵල ලබාගැනීම සඳහා දියුණු රටවල් විද්‍යා හා තාක්ෂණික දැනුම යහමින් උපයෝගී කර ගන්නා අතර දුප්පත් රටවල් ඒවායේ අඩු ආදායම් තත්වය සහ අඩු උනන්දුව නිසා මෙම දැනුම එතරම් උපයෝගී කර ගැනීමක් දක්නට නැත. තෙවැනි ලෝකයට අයත් ශ්‍රී ලංකාවද ලෝකයේ සංවර්ධිත රටක් බවට පත්වීම සඳහා නිරන්තර අරගලයක යෙදී සිටින අතර ඉහත කී තත්වය එය තුළ පැහැදිලිවම දක්නට ලැබේ. වඩා දියුණු තත්වයකට ළඟා වීමේදී යම් රටක් දුගී බව තුරන් කිරීම තම ප්‍රධාන අරමුණ බවට පත් කර ගනී. මෙසේ කිරීමේදී ශ්‍රී ලංකාව වැනි රටක් දියුණු කිරීමට "විද්‍යාත්මන දැනුම යොදා ගැනීම" මගින් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වනු ඇත.

මෙවර "විදුරාව" සඟරාව "විද්‍යා සන්නිවේදනය" පිළිබඳ සිය අවධානය යොමු කර ඇත. භාවිතා කළ හැකි පිරිස වෙත විද්‍යාත්මක දැනුම ව්‍යාප්ත කිරීම විද්‍යා සන්නිවේදනය ලෙස හැඳින්විය හැක. විද්‍යාත්මක දැනුම එය භාවිතා කරන්නන් සහ සාමාන්‍ය ජනයා අතට ගෙන යා හැකි විවිධ ක්‍රම සහ මංපෙත් අප රට තුළ දක්නට ලැබේ. ගුවන්විදුලියෙන් සහ රූපවාහිනියෙන් විද්‍යා වැඩසටහන් ප්‍රචාරය කිරීම, සඟරා, පොතපත, පුවත්පත් වැනි මුද්‍රිත මාධ්‍ය මගින් විද්‍යාත්මක දැනුම ව්‍යාප්ත කිරීම අප රට තුළ නිති පතා සිදු කෙරේ.

ජාතික විද්‍යා පදනම 1976 වසරේ සිට වසර 25 කට අධික කාලයක් මුළුල්ලේ "විදුරාව" විද්‍යා සඟරාව මුද්‍රණය කර බෙදා හරී. මෙය මගින් නොයෙකුත් ගැටළු පිළිබඳව විද්‍යාත්මකව සාකච්ඡා කර ඇති අතර මේ නිසාම ජාතික විද්‍යා පදනමට විද්‍යාත්මක දැනුම සාමාන්‍ය ජනතාව වෙත ව්‍යාප්ත කිරීම පිළිබඳ වසර ගණනාවක මනා පළපුරුද්දක් ඇති බව කිව යුතුය.

විද්‍යා සන්නිවේදනය පිළිබඳව වූ මෙවර "විදුරාව" කලාපය විද්‍යා සන්නිවේදකයනට, නැගී එන තරුණ විද්‍යාඥයිනට සහ පාසැල් ළමුන්ට ඉතා වැදගත් වන බව කිව හැකිය. මෙම කලාපයට ප්‍රධාන වශයෙන් ලිපි හයක් (06) අත්දැකීම් සපිරි ලේඛකයින් සය දෙනෙකු විසින් සපයනු ලැබ ඇති අතර, ඒවා මගින් සාමාන්‍ය ජනයා වෙතට විද්‍යා සන්නිවේදනය කෙසේ කළ යුතුද යන්න පිළිබඳව සහ විද්‍යා සන්නිවේදනයෙහි ලා විවිධ වූ මාර්ග අනුගමනය කිරීම මගින් වඩා යහපත් විද්‍යා ලේඛකයෙකු වන්නේ කෙසේද යන්න පිළිබඳවද මනා අවබෝධයක් ලබා දෙන බව කිව යුතුය. විද්‍යා සන්නිවේදනය පිළිබඳ මෙම පණිවුඩය අප විසින් ඉලක්ක කර ගත්තා වූ සාමාන්‍ය ජනතාව වෙත ළඟා වේ නම් අපගේ මෙම ප්‍රයත්නය සාර්ථක වූ බවට එය සාධකයක් වන්නේ මය.

**සංස්කාරක**

VIDUS 21-1-3

# සමාජ අධ්‍යාපනය සඳහා කාර්යක්ෂම සංනිවේදනයේ මූලධර්ම

**මහාචාර්ය එම්.ටී.එම්. ජිෆ්රි**
සභාපති
විද්‍යා සංනිවේදනය පිළිබඳ විශේෂ කමිටුව
ජාතික විද්‍යා පදනම

## හැඳින්වීම

සංනිවේදනය යනු ජීවත් වන සියලු දෙනා විසින් කරනු ලබන වැදගත් සහ අත්‍යාවශ්‍ය ක්‍රියාවකි. මිනිසා පිළිබඳ සලකා බැලීමේ දී මෙය විශේෂතම හැකියාවකි. පාරම්පරිකව සහ ජීව විද්‍යාත්මකව ලබා ගත් හැකියාවන් උදව් කර ගෙන වත්මන් තාක්ෂණය යොදා වඩාත් සුමටව, පිළිවෙලකට සහ කාර්යක්ෂමව සංනිවේදනය කිරීමේ හැකියාවක් මිනිසා සතු වෙයි. සංනිවේදනයේ අවසන් ඉලක්කය වන්නේ එක තැනැත්තෙක් හෝ ප්‍රභවයක් සතු තොරතුරු තව කොටසකට ලබා දීමය. මූලික වශයෙන් විවිධ මාධ්‍ය මගින් සහ විවිධාකාර ලෙස සංනිවේදනය කළ හැක.

ආදී වාසීන් අතර සංනිවේදනය සංඥමය භාෂාවක් ලෙසින් වර්ධනය වී පසුව එය ස්ථිර ශිලා ලේඛන වල ස්වරූපයක් ගති. ඉන් අනතුරුව, ක්‍රමයෙන් තාක්ෂණය දියුණු වීමත් සමගම මුද්‍රිත මාධ්‍ය වඩාත් ජනප්‍රිය සංනිවේදන ක්‍රමයක් ලෙස භාවිතයට පත්විය. පසුව දුරකථන පද්ධතිය සහ ගුවන්විදුලි තාක්ෂණ ක්‍රම සොයා ගැනීමත් සමග සංනිවේදන ක්ෂේත්‍රය ඉතා ඉක්මන් ප්‍රගතියක් ලබා ගත්තේ ය. කෘත්‍රිම චන්ද්‍රිකා තාක්ෂණය, පරිගණකය හා රූපවාහිනිය නිපදවීමත් සමගම මෙම සංනිවේදන ක්‍රමය තව දුරටත් වේගවත් විය. බහු තාක්ෂණ සහ මාධ්‍ය ජාල හේතු කොට ගෙන අඛණ්ඩව ව්‍යාප්ත වන ගෝලීය සංනිවේදන ලෝකයක් තුළ අද අපි ජීවත් වෙමු.

ඉහත සඳහන් වැඩි දියුණු තත්වය සලකා බැලීමේ දී සංනිවේදනය ලබා දිය හැකි විවිධ අංශ ගණනාවක් දැනට ඇත. ඒවා නම් ;

* ස්වභාවය
* අවශ්‍යතාවය
* ඉලක්ක කරගත් කණ්ඩායම
* යොදා ගත් මාධ්‍ය
* ක්‍රියාත්මක කළ ආකාරය
* පාවිච්චි කරන ලද ක්‍රම
* වෙන් කරන ලද කාලය
* ලබාගන්නා ලද පශ්චාත් තොරතුරු යනාදිය වේ.

දිනපතා කාර්යයන් සඳහා අදාල මූලික සංකල්ප සහ විද්‍යාත්මක ක්‍රම ගැන ද මහජනතාව දැනුවත් කිරීමට අදාල කාර්යක්ෂම සංනිවේදනයේ මූලධර්ම පිළිබඳව ද කරුණු මෙම ලිපිය මගින් මම ඉදිරිපත් කරමි.

## පණිවිඩයේ ස්වභාවය

මෙම අදාළ ප්‍රශ්නයේ පණිවිඩය වන්නේ අප සමාජයේ ජනතාවගේ දෛනික ක්‍රියාකාරකම් හා සම්බන්ධ සරල විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ අවධානය යොමු කිරීමයි. එනම්, ඕනෑම විද්‍යාත්මක සංකල්පයක් එහි මූලික සහ පැහැදිලිව තේරුම් ගත හැකි ස්වරූපයකට පත් කිරීමයි. එම නිසා එහි අන්තර්ගත කරුණු නිසි පරිදි සැළසුම් කර, තර්කානුකූලව හා පියවරෙන් පියවර ඉදිරිපත් කිරීමට අවශ්‍ය වෙයි. ඒ ඒ පුද්ගලයාගේ නිර්මාණශීලී බව උදව් වන්නේ මෙහිදීය.

සංනිවේදකයා තමා දීමට අදහස් කරන පණිවිඩයේ ස්වභාවය පළමුවෙන් තේරුම් ගත යුතුය. එය (අ) දෛනික අත්දැකීම් වලට කෙලින්ම බලපාන දෙයක් ද (ආ) යම් හේතුවක් පිණිස එය ප්‍රයෝජනවත් ද? නැතහොත් (ඇ) දැන ගැනීමට හොඳ දැනුම් කොටසක් ද යන්න ඒ ස්වභාවය විය හැක.

## පණිවිඩයේ පරමාර්ථය

ඉදිරිපත් කිරීමට පෙරාතුව පණිවිඩයේ පරමාර්ථය හෝ හේතුව පිළිබඳව පැහැදිලි අවබෝධයක් ඉදිරිපත් කරන්නා

තුළ තිබිය යුතුය. මෙමගින් පණිවිඩයේ ප්‍රධාන පරමාර්ථය එය ලබන්නාට වඩාත් පැහැදිලිව තේරුම් යනු ඇත. මීට අමතරව, ඉදිරිපත් කිරීමට පෙරාතුව එහි පරමාර්ථය අර්ථකථනය කිරීමත් සමගම තමා ඉලක්ක කර ගත් මාතෘකාව සහ එහි පරමාර්ථය නියම මාර්ගයෙන් පිට පැනීම වැළැක්වීමට තමා විසින්ම පනවා ගත් බාධක හෝ සීමාවන්ද තිබිය හැක. තවදුරටත් එසේ කිරීමෙන් එබඳු පෙර හඳුනාගැනීම් සාකච්ඡා කරන මාතෘකා වල දිග සහ ගැඹුර එහි අන්තර්ගතයට පමණක් සීමා කිරීමට හේතු වනු ඇත. නොඑසේ නම් එය ලබන්නාට ව්‍යාකූල බවක් හෝ අනවශ්‍ය ලෙස බර පැටවීමක් සිදු වනු ඇත.

## ඉලක්ක කරගත් කණ්ඩායම

අත්පිටපත් පිළියෙල කිරීමේදී, එම පණිවිඩය ඉලක්ක කරගත් කණ්ඩායමේ ස්වභාවය හඳුනා ගැනීම ගැන නිසි අවබෝධයක් තිබීම ඉතාමත් වැදගත්ය. යොදා ගන්නා ලද භාෂා විලාශය, දෙනු ලබන උදාහරණ, ඉදිරිපත් කරනු ලබන පණිවිඩයේ ගැඹුර සහ අරමුණු කර ගත් විශේෂිත හේතුව යන මේ සියල්ල ඉලක්ක කර ගත් කණ්ඩායමේ ස්වභාවය මත රඳා පවතී. ඉල්ලක කර ගත් කණ්ඩායම් වල විශේෂ ස්වභාවය ගැන් සැලකිය යුත්තේ (i) ඔවුන් කථා කරන භාෂාව (ii) වයස සහ ගැහැණු පිරිමි බව (iii) අධ්‍යාපනයේ මට්ටම (iv) ඔවුන් සතු පොදු වැඩ කරන ක්‍රම සහ ඇල්ම (v) ආගම සහ ජනවාර්ගික බව යන කරුණු ගැන අවධානය යොමු කිරීමෙනි.

ඉලක්ක කර ගත් කණ්ඩායමේ දෛනික ක්‍රියාකාරකම් සමග ඇති සමීප බව මෙන්ම, එම පණිවිඩය දෙන අතරතුර ඔවුන්ගේ අභිලාශය මුදුන්පත් කිරීම ගැනද නිවේදකයා උනන්දුවක් දක්වන්නේ නම් එය වඩාත් ප්‍රතිඵලදායක වනු ඇත. එබඳු අභ්‍යාසයක් සංනිවේදකයාත්, එම පණිවිඩය ලබන්නාත් අතර වඩාත් සමීප බවක් ඇති කරවන අතර, දෙපාර්ශවයටම එය මහත් පහසුවක් වනු ඇත. යම් සංනිවේදනයක නියත ප්‍රතිචාරයක් ඇති බව මතක තබා ගත යුතුය. එනම්, එය ලබන්නා කෙලින්ම සංනිවේදකයාට ප්‍රතිචාරයක් නොදැක්වුවද, ඔහු හෝ ඇය තුළ එම පණිවිඩයට ප්‍රතික්‍රියාවක් ඇති බවය.

## යොදා ගන්නා ලද මාධ්‍යය

ශ්‍රී ලංකාව ගැන සලකා බැලීමේ දී යොදා ගන්නා ලද් භාෂාව වැදගත් තැනක් ගනී. ඇතැම් අවස්ථාවලදී සංකල්ප ඉදිරිපත් කිරීමේ දී ගැඹුරු විද්‍යාත්මක තාක්ෂණික භාෂාව යොදා ගැනීම අවශ්‍ය වුවද, ඉලක්ක කරගත් කණ්ඩායමට එහි මූලධර්ම සරල බසින් විස්තර කළ යුතුය. එය කරන වගන්ති සරල විය යුතුය. කෙටි විය යුතුය. දෛනික ක්‍රියාකාරකම් වලට අදාළ දේ ගැන විශේෂිත අවස්ථා හෝ තැන් ගැන විස්තරයක් කිරීමට උත්සාහයක් ගත යුතුය. යම් කරුණක් පැහැදිලි කිරීමේදී, ඇතැම් විට එය යලි යලිත් කීම උපකාරයක් වනු ඇත. වචන වලින් සංනිවේදනය කිරීමේදී මෙය වඩාත් අදාල වනු ඇත. එහි සිංහල හෝ දෙමළ වචන යම් ව්‍යාකූල බවක් පෙනෙනු ඇත. එම නිසා වඩාත් පහසු සහ ඵලදායක සංනිවේදනයක් සඳහා මිශ්‍ර භාෂාවක් යොදා ගැනීමට සංනිවේදකයාට ඉඩ කඩ ඇත.

දීමට යනු ලබන පණිවිඩයේ පෙර සැළසුම් කිරීමක් මගින් මිශ්‍ර සහ වඩාත් දීර්ඝ විස්තරයක් සැපයීමේ අවශ්‍යතාවය සොයා ගත යුතුය. ඇතැම් විට "නියමු" ඉදිරිපත් කිරීමක් මගින් මෙය කළ හැකිය.

## ප්‍රයෝජනයට ගන්නා ලද ක්‍රම

ඇතැම් විට කරුණු ඉදිරිපත් කිරීම තනි හෝ බහුවිධ ක්‍රම හෝ විය හැකිය. එසේ යොදා ගන්නා ක්‍රම ඇතැම් විට මුද්‍රිත, වාචික, විද්‍යුත් (ශ්‍රව්‍ය /දෘශ්‍ය) හෝ අන්තර් ක්‍රියාකාරී පහසුකම් වෙයි. ඉදිරිපත් කරන ක්‍රම රඳා පවතින්නේ (i) මාතෘකාවේ ස්වභාවය, (ii) ලබා ගත හැකි පහසුකම්, සහ (iii) සංනිවේදකයාගේ තෝරා ගැනීම මතය.

## යොදා ගන්නා ලද ක්‍රම

ඉදිරිපත් කිරීමේදී ක්‍රම හෝ තාක්ෂණ ගණනාවක් යොදා ගත හැක. ඒවා (i) එක මගක ඉදිරිපත් කිරීම (විශේෂයෙන් මුද්‍රිත මාධ්‍යය), (ii) ඉදිරිපත් කරන දෙබස් සහිත සම්මුඛ සාකච්ඡාවන් කිරීම (iii) සම්පත් දායකයන් කීප දෙනෙක් අතර කෙරෙන සාකච්ඡාවක් ලෙස හෝ (iv) ප්‍රේක්ෂකයින් සමග කරන සංවාදාත්මක සැසියක් ලෙස විය හැකිය. නැවතත්, මෙම තත්ව හෝ ක්‍රම ගණනාවක් යොදා ගැනීම රඳා පවතින්නේ සංනිවේදකයාට ලබා ගත හැකි සම්පත් සහ ලබාදී ඇති කාලය මතය.

## කැප කළ කාලය

ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන කරුණු කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වන්නේ ලබාදී ඇති කාලයයි. වාචික ඉදිරිපත් කිරීම් වලදී ඉදිරිපත් කරන කරුණුවල ගුණාත්මක භාවය රඳා පවතින්නේ මෙම කාලය මතය. එම නිසා සංනිවේදකයෙකුට තමාට අවශ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා සරිලන කාලයක් ලබාදී තිබීම වැදගත්ය. මෙම කාලය තුළ (i) මාතෘකාව හඳුන්වා දීම (ii) පරමාර්ථ විස්තර කිරීම

(iii) ප්‍රේක්ෂකයින් තුළ දැනටමත් තිබෙන දැනුම හා සම්බන්ධ කිරීම (iv) නව දැනුම හඳුන්වා දීම (v) එහි ඇති අදල බව සහ යොද ගැනීම සහ (vi) එහි විශේෂිත කරුණු සම්පිණ්ඩය කිරීම යනාදිය ඉටු කිරීමට සංනිවේදකයාට හැකි විය යුතුය.

## ලබා ගත් පශ්චාත් කරුණු

යම් ඉදිරිපත් කිරීමකදී කරුණු සම්පිණ්ඩනය කිරීම සහ යලිත් ආවර්ජනය කිරීම වැදගත්ය. ඒවා ලබා ගත් තැනැත්තාට එම කරුණු තේරුම් ගත් අන්දම ගැන ආවර්ජනයක් කිරීමත් වැදගත්ය. එලෙසම ඉදිරිපත් කිරීම අවසානයේ දී ප්‍රේක්ෂකයන්ගෙන් තමා ඉදිරිපත් කළ කරුණු වල සඵලතාවය ගැන කරුණු ලබා ගැනීමත් වැදගත්ය. මේ සඳහා ප්‍රශ්න පත්‍රයක් ඉදිරිපත් කිරීම ග්‍රාහකයාගේ හෝ ඉලක්ක කණ්ඩායම්වල ප්‍රතිචාරය ලබා ගැනීමට ක්‍රමවත් මාර්ගයක් වෙයි.

මෙම කෙටි ලිපියෙන්, සංනිවේදනයේ මූල ධර්ම ගැනත්, එය වඩාත් තේරුම් සහිත සහ ඵලදයී ලෙස යොද ගත හැක්කේ කෙසේ ද යන්න ගැනත් කරුණු අවධාරණය කිරීමට මම උත්සාහ කළෙමි.

VIDUS 21-1-6

# විද්‍යා සන්නිවේදනයේ මුහුණුවර

**පර්සි ජයමාන්න**

"දැනුම සිත්ගන්නාසුලු බව වටහා ගැනීම මිනිසකු සිය ජීවිතයේ දී ලබන ශ්‍රේෂ්ටතම අත්දැකීමයි." සිය මිතුරන් හා හැංගිමුත්තන් කෙළිමින්, වැලිබත් පිසිමින් තම නිවෙස තුළ ම වැඩෙන ළමයෙක් කල්යාමේ දී ජීවිතයේ මීට වැඩි යමක් ඇතැයි වටහා ගනියි.

"සිය නිවෙසින් බැහැර පරිසරයට පා තබන ඔහුට දිනෙක කුරුල්ලෙක් හමු වෙයි. වරක් හේ ලස්සන ගල් කැටයක් අහුලයි. ඒ කුරුල්ලා තවත් කුරුල්ලෙකුගෙන් වෙනස් වන්නේ ඇයි? ඒ ගල්කැටය තවත් ගල් කැටයකට වඩා වෙනස් ඇයි? ආදී වශයෙන් ඒවා කෙරෙහි විමසිලිමත් වෙයි. කුරුල්ලා පියාඹන අයුරුත් ගල් කැටය සෑදී ඇති අයුරුත් හේ විපරම් කරයි. අනතුරුව හේ කිසියම් සිතිවිල්ලක් ඔස්සේ මේවා ගැන නොයෙකුත් ප්‍රශ්න මතු කරයි. තනිවම ඒවාට පිළිතුරු සොයන්නට වෑයම් කරයි. මෙසේ හදිසියේම දැනුම සිත්ගන්නාසුලු බව ඔහුට වැටහී යයි. දැන් හේ නව ලෝකයකට පා තැබූවෙකි. නා නා දෑ අතර අරුම සැබඳියාවක් ඇති මේ අද්භූත ලෝකයෙහි හේ දැන් සැරිසරයි."[1]

විද්‍යා සන්නිවේදනයට මා පොළඹවා ලූ එක් පොතක ආරම්භයේ සටහන්ව තිබූ ඉහත ජේදය අදත් මගේ මතකයට එන්නේ මේ දැන් කියවූ දෙයක් ලෙසටය. පොතේ නමත් **"විද්‍යාව"** ය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පරිවර්තනය කරවා පළ කරන ලද එම පොත සිංහලෙන් විද්‍යාව හඳුන්වා දීමේ දී ඉතා විශාල මෙහෙයක් දශක තුනකට ඉහතදී ඇරඹූ බව මා මෙහිලා සඳහන් කරන්නේ ඉන් ආභාෂය ලත් විද්‍යා සන්නිවේදකයන් විශාල පිරිසක් අනාගත පරපුරට දැනුම ලබා දීමට නොතිත් ආශාවෙන් කටයුතු කරන බැවිනි.

විද්‍යා සන්නිවේදනය කෙබඳු ආකාරයකට ආරම්භ කළ යුතුද යන්නට හොඳ උදාහරණයක් ලෙසට මම ඉහත සඳහන් ජේදය දකිමි. සාමාන්‍ය පාඨකයෙකුට විද්‍යාත්මක කරුණු පහදා දීමේ දී තිබිය යුතු ඉතා හොඳ ප්‍රවේශයක් එහි ඇතැයි මම සිතමි. එසේම විද්‍යා සන්නිවේදනයේ දී තිබිය යුතු සරල බව, නිශ්චිත බව හා කිසියම් එල්ලයක් කරා යා යුතු බව ද එහි ඇත.

විද්‍යාව ඇරඹුණේ කුතුහලයෙනි. එබැවින් විද්‍යා සන්නිවේදනය ද ඇරඹිය යුත්තේ කුතුහලයෙන් යැයි මම සිතමි. ඒ බව ලෝකයේ ශ්‍රේෂ්ඨතම විද්‍යා සන්නිවේදකයා ලෙස සැලකෙන ආචාර්ය **ඉසාක් ඇසිමොව්** සිය **"ගයිඩ් ටු සයන්ස්" (විද්‍යාවට මග පෙන්වීම)** නම් කෘතියෙන් ද අවධාරණය කර ඇත. ඔහු ඒ කෘතිය ආරම්භ කරන්නේ මෙසේ ය.

"මුළුමණින්ම වාගේ පැවතියේ කුතුහලයයි"

"කුතුහලය, යටපත් කළ නොහැකි දැන ගැනීමට ඇති නොතිත් ආසාව, පණ නැති දෙයක දක්නට ලැබෙන්නක් නොවේ. එසේම එය සමහර ජීවී ප්‍රභේදයන් තුළ දක්නට ලැබෙන්නක් ද නොවේ. අප ජීවත් වන බව, අපේ සජීවී බව කියා පාන හොඳම සාධකය වන්නේ ද එයයි.

"ගසක් තම අවට පරිසරය කෙරෙහි කුහුලක් නොදක්වයි. අඩු තරමින් අපට හඳුනා ගත හැකි ක්‍රමයකට නොදක්වයි. ස්පන්ජියෙක්, බෙල්ලෙක් වුනත් එහෙමයි. සුළඟ, වැස්ස, සාගර තරංග, ඔවුනට අවශ්‍ය දේ ළඟටම ගෙනවුත් දෙයි. ඔවුහු ඉන් තමනට ගත හැකි දේ ගනිති. එහෙත් යම් හෙයකින් ගින්න, වසවිස, විලෝපිකයන්, පරපුටුවන් හෝ ඔවුන් වෙත එළඹුණා නම් ඔවුන් එතෙක් ජීවත් වූ ආකාරයට ම නිහඬ ව විරෝධයක් නොපා ම මරණයත් බාර ගනීවි".

"ජීවය ආරම්භයේ දී ම වාගේ සමහර ජීවීහු කෙසේ හෝ නිදහස් චලනයක් ඇති කර ගන්නට තැත් කළහ. එය පරිසරය ජය ගන්නට ගත් යෝධ පියවරක් විය. චලනය වන ජීවියාට තවදුරටත් කෑම තමන් කරා එන තෙක් බලා සිටීමට අවශ්‍ය නොවිය. ඔහු කෑම සොයා යන්නට පටන් ගත්තේය. ලෝකයට ගවේෂණය ආවේය. කුතුහලය උපන්නේ ය."[2]

විද්‍යාව මිනිසාගේ අවධානයට ලක් වූ හැටි දක්වන්නට **ඇසිමෝව්** තම කෘතියෙන් ඒ ගත් උත්සාහය මෙන් පාඨකයා තුළ කුහුල අවුස්සා ඒ මගින් පාඨකයා ඇද බැඳ තබා ගෙන තම කාරිය කිරීමට ලේඛකයා සමත් විය යුතුය. තමන් ලියන්නට යන විෂයය කුමක් වුවත් ලේඛකයා ඒ සඳහා පේ විය යුතුය. විෂයය කරුණු නිවැරදි යැයි සැක හැර දැන

ගත යුතුය. තමන්ගේ අදහස ශක්තිමත් ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය සාධක සපයා ගත යුතුය. කරුණු පැහැදිලි ව ඉදිරිපත් කිරීමට රූප සටහන් අවශ්‍ය නම් ඒවා සපයා ගත යුතුය. ඉන් පසු ලිපියේ ප්‍රවේශය ගැන වැඩි අවධානයක් යොමු කළ යුතුය. කුමන ආකාරයට ලිපියට පිවිසුණහොත් පාඨකයා වඩාත් හොඳින් ග්‍රහණය කර ගත හැකි දැයි කල්පනා කළ යුතුය. මේ සඳහා විකල්ප කීපයක් ගැන සිතා විමසා හොඳ ම විකල්පය තෝරා ගැනීම වඩාත් සුදුසුය.

## උචිත ප්‍රවේශයක වැදගත්කම

වඩාත් උචිත සිත් ගන්නාසුලු ප්‍රවේශයන් සඳහා ඕනෑ තරම් නිදසුන් දැක්විය හැකිය. **ආචාර්ය ඉසාක් ඇසිමෝව්ගෙන්** ම නිදසුනක් ගනිමු. උද්භිද විද්‍යාවට අදාළ ශාක ලෝකය ගැන ලිපියක් ලියන **ඇසිමෝව්** එය ආරම්භ කරන්නේ රහස් පරීක්ෂක කතාවක් ලෙසිනි. ලිපිය ආරම්භයේදී ම ඔහු ලෝක ප්‍රකට රහස් පරීක්ෂක චරිතය වන "ෂර්ලොක් හෝම්ස්" ගෙන එයි. ෂර්ලොක් හෝම්ස් ගෙවුයනක සිදුවූ මිනීමැරුමක් ජායාරූප ඇසුරෙන් පිරික්සයි. මරණයට ලක් වූ තැනැත්තා විනෝදයට මල් වැවූ අයෙකි. දරුණු පහර දීමකට ලක්ව ඔහු මිය ගොස් සිටියේ ද මල් ගොමුවකදී ය. මියගිය තැනැත්තාගේ අතෙහි බැඳී බිඳී නතරවී තිබුණු ඔරලෝසුවේ වේලාවත් ඔහු පහරදීමට ලක්වූ වේලාවත් අතර වෙනසක් ෂර්ලොක් හෝම්ස් දකියි. ඔහු මියගිය තැනැත්තාගේ දේහය අසල මල් ගොමුවේ විශේෂත්වයක් දකියි. එහි මල් වවා ඇත්තේ ඔරලෝසු මුහුණතක ආකාරයටය. දවසේ එක එක වේලාවට විකසිත වන මල්, වේලාව දක්වන පරිද්දෙන් පෙළ ගස්වා සිටුවා තිබේ. මිනීමරුවා රහස් පරීක්ෂකයන් නොමග යැවීම පිණිස ඔරලෝසුවේ කටු වෙනස කර ඇති බව ෂර්ලොක් හෝම්ස් සොයා ගන්නේ මල් පිපුණු වෙලාවෙනි. මෙසේ තම ලිපිය ආරම්භ කරන **ඇසිමෝව්** දවසේ පැය විසිහතර තුළ පැයෙන් පැයට විකසිත වන මල් වර්ග උද්භිද නාමයන් සමග ඉදිරිපත් කරයි. ඉන්පසු **ඇසිමෝව්** අතින් ලියවෙන්නේ ශාක ලෝකයේ අරුමය දක්වන අපූරු ගවේෂණාත්මක ලිපියකි.[3]

**"විද්‍යාවේ වදන් හා ඒවා පසුපස ඇති ඉතිහාසය"** (Words of Science and the History Behind Them), නමින් කෘතියක් ලියන **ඇසිමෝව්** විද්‍යා වදන් හැදුනු හැටි සහ ඒ වදන් පසුබිමේ ඇති රසවත් විස්තර ඉදිරිපත් කරන්නේ විද්‍යාව තමන්ට නොතේරෙන විෂයයෙකැයි බැහැරන කෙනෙකු වුවද විද්‍යා රසිකයෙකු බවට පත් කර ගන්නා අයුරිනි. එහි ආරම්භයේදී ම ඔහු මද්‍යසාර සඳහා විද්‍යාවේදී භාවිත කරන ඇල්කොහොල ගැන කියන්නේ එය අතීතයේ දී අරාබි කතුන් භාවිතා කළ සුවඳ විලවුන් විශේෂයක් බවයි. ඔහුගේ එම ලිපිය ඇරඹෙන්නේ මෙසේය. "සියවස් ගණනක් තිස්සේ සිය දෑස් ලොකුවටත් දීප්තිමත්වත් පෙනෙනු සඳහා කාන්තාවෝ ඇස් පිහාටු කළු කළහ. අරාබි කාන්තාවෝ මේ සඳහා ඉතා සියුම් ලෙස කුඩු කරන ලද අංජන විශේෂයක් භාවිතා කළහ. "ඉතා සියුම්වන සේ කුඩු කරන ලද" යන අරුත් ඇතිව ඔවුහු ඒවාට "ඇල්කොහොල" (al koh'l) යැයි කියුහ".[4]

විද්‍යාවේ ඉතිහාසය නොයෙක් අයුරින් ලිවිය හැකිය. මුලින්ම මිනිසා කුහුල නිසා ලෝකය ගවේෂණය කරන්නට පටන් ගත් තැන් සිට ලියන්නට පුළුවන. නො එසේ නම්, කාලවකවානු වලට හෝ යුග වලට බෙදා එක් එක් යුග වල සිදු වූ වෙනස්කම් දක්වමින් ලියත හැකිය. තවත් විදියකින් ලියන්නේ නම් ක්‍රි.පූ. 15,000 දී පමණ ගල් යුගයේ මිනිසාගේ මෙවලම් වලින් පටන් ගෙන මේ දක්වා කර ඇති නිර්මාණ පෙළ ගස්වමින් කළ හැකිය. එහෙත් **ඉසාක් ඇසිමෝව්** එය කරන්නේ අමුතු විදියකටය. ඔහුගේ විද්‍යා ඉතිහාසය ලියා ඇත්තේ නවීන විද්‍යාඥ පරපුරේ ආරම්භකයා ලෙස සැලකෙන ක්‍රි.පූ. 2980-2950 කාලයේ මිසරයේ (ඊජිප්තුවේ) විසූ **ඉම්හොටෙප්** (Imhotep) ගෙන් පටන්ගෙන **ආමෝස්** (Ahmose), **තේල්ස්** (Thales) **අනෙක්සිමැන්ඩර්** (Anaximander), **පයිතගෝරස්** (Pythagoras) ආදීන්ගේ සිට **නීල් ආම්ස්ට්‍රෝන්, කාල් සේගන්,** (Sagan) ශ්‍රී ලංකාවේ **සිරිල් පොන්නම්පෙරුම,** හා අවසානයේ දී තමන්වත් දක්වමිනි. මෙම කෘතියේදී ඔහු විද්‍යාඥයන් ගේ පුද්ගලික ජීවන තොරතුරු වලට වැඩි අවධානයක් යොමු කර නැත. ඒ වෙනුවට ඔහු විෂයයන්ට අදාළ කරුණු හා විද්‍යාත්මක ජයග්‍රහණ තුළින් මිනිසා මෙතෙක් ලබා ඇති දැනුම පෙළ ගස්වන්නට සමත්වී ඇත. අත්‍යාවශ්‍යම තැනක විද්‍යාඥයන් ගේ චරිත ලක්ෂණ මතු කළද මෙම වටිනා කෘතිය මගින් ලෝකයේ ශ්‍රේෂ්ට මිනිසුන් වූ ඒ මහා විද්‍යාඥයන්ගේ මනස් තුළ පහළ වූ, ඔවුන් විසින් අපට දයාද කර ඇති මහා දැනුම් සම්භාරය කුළුගන්වා තිබේ. **ඇසිමෝව්ගේ "විද්‍යාව හා තාක්ෂණවේදය පිළිබඳ ජීවන චරිත විශ්වකෝෂය"** (Asimov's Biographical Encyclopedia of Science and Technology)[5] නම් ඒ කෘතිය **ඇසිමෝව්** සිය ජීවිත කාලය තුළ ලියූ සිය ගණනක් කෘතීන් අතර සුවිශේෂ තැනක් ගන්නා එකකි. මෙහි තොරතුරු දක්වා ඇත්තේ විද්‍යාඥයන් ලොව පහළ වූ අනුපිළිවෙල අනුව වන බැවින් විද්‍යාවේ ඒ ඒ ප්‍රගතිය ක්‍රමානුකූලව ඒ ඒ චරිත තුළින් කියැවිය හැකිය.

සාමාන්‍ය ජනතාවට විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කරන කරුණු ඉතා සරල විය යුතුය. නිවැරදි විය යුතුය. එපමණක් නොව අවිවාදයෙන් පිළිගත හැකි සම්මත කරුණු මත තර්කානුකූලව

ගොඩනැගුණු ඒවා විය යුතුය. විද්‍යා සන්නිවේදනයේ දී ඒ සඳහා සන්නිවේදකයා දැඩි වෙහෙසක් ගත යුත්තේ එබැවිනි. ඔහු ඒ සඳහා විෂය දැනුමැති අයගේ සහාය ලබා ගත යුතුය. නො එසේ නම් ඒ පිළිබඳව හොඳින් පොතපත පරිශීලනය කොට අධ්‍යයනය කළ යුතුය.

විද්‍යාව යනු හුදු කරුණු සමූහයක් නොව සාමාන්‍ය ජනතාව අතර සෑම තරාතිරමක අයත් අප හැමදෙනාගේම එදිනෙදා දිවිපැවැත්ම හා බැඳී අප හැමදෙනම වෙළාගෙන පවතින්නක් බව අවබෝධ කර ගත යුතුය. කරුණු ඉදිරිපත් කිරීමේ දී වචන පමණක් නොව චිත්‍ර හා ඡායාරූප එක්කර ගැනීමෙන් වඩාත් සිත් කා වදින අයුරින් සාර්ථකව ඉදිරිපත් කළ හැකිය.

විද්‍යාව ඉගෙනීමත්, ඉගැන්වීමත් පිළිබඳව ප්‍රධාන අරමුණු දෙකක් පෙන්වා දිය හැකිය. විද්‍යාව ඉගෙනීමෙන් එය ඉගෙන ගන්නා තැනැත්තාට පරීක්ෂණ මගින් සත්‍යයයි තහවුරුවී ඇති කරුණු පදනම් කර ගෙන තර්ක කිරීමෙන් යම් ගැටළුවක් පිළිබඳව අවංක විනිශ්චයකට එළැඹීම සඳහා ලැබෙන බුද්ධිමය පුහුණුව මින් එකකි. අනෙක විද්‍යාත්මක අනාවරණ මගින් මනුෂ්‍ය වර්ගයාගේ සුබසිද්ධිය සඳහා ලැබෙන සේවයත් දැනුම් නිම්වළලු පුළුල්වීමත් නිසා අඩුතරමින් විද්‍යාවේ මූලධර්ම පිළිබඳව වත් සාමාන්‍ය දැනීමක් නැති අයගේ දැනුම සම්පූර්ණ බවට පත් කිරීමයි.

"ජීවිතයේ සෑම අංශයකටම, විශේෂයෙන්ම සෞඛ්‍යයත්, සෞභාග්‍යයත් සම්බන්ධයෙන් විද්‍යාව තදින්ම බලපාන බැවින් හැම රටවැසියෙකුටම විද්‍යාව පිළිබඳ දැනුමක් අවශ්‍යයි. විද්‍යාඥයින්ගේ කටයුතුත්, විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ දැනුමත් මෙහි ලා මුල්තැනක් ගනී. සාමාන්‍ය ජනයාට එක් අංශයකින් පමණක් විශේෂ පුහුණුවක් ලබා දීම අනවශ්‍යයි. එසේම යෝග්‍ය ද නොවේ. මේ නිසා හැම කෙනෙකුටම ඉතා පුළුල් අයුරින් විද්‍යාව ඉගැන්වීම අත්‍යාවශ්‍ය බව දැන් අවිවාදයෙන්ම පිළිගෙන ඇත."[6]

එදිනෙදා ජීවිතය ගෙන යාමට විද්‍යාවෙන් ලැබෙන පිටුවහල මෙතෙකැයි කියා දැක්විය නොහැකිය. නිදසුනක් වශයෙන් සෞඛ්‍ය හා පෝෂණ විද්‍යාත්මක දැනුම පිළිබඳ අවශ්‍යතාව දැක්විය හැකිය. එම විෂයයන් අද මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල ඉතා ජනප්‍රිය විශේෂාංග බිහි කිරීමට මග පාද ඇත.

## විද්‍යාත්මක ක්‍රමය

සාර්ථක විද්‍යා සන්නිවේදනයක් සඳහා කළ යුත්තේ ද සාමාන්‍යයෙන් විද්‍යාව අනුගමනය කරන විද්‍යාත්මක ක්‍රමයම භාවිතා කිරීමය. විද්‍යාඥයෙකු යම් කාර්යයක් දෙස බලන්නේ විදුහුරු ඇසෙකිනි. ඔහු දැනුම ලබා ගන්නේ විදුහුරු ක්‍රමයකිනි. ඒ විද්‍යාත්මක ක්‍රමය අනුව දැනුම ලබා ගැනීමට අනුගමනය කළ යුතු පිළිවෙළ මෙසේ පෙළ ගස්වා දැක්විය හැකියි.

1. මුලින්ම නිරීක්ෂණය කිරීම
2. ඊළඟට නිගමනය කිරීම
3. කල්පිතයක් ලෙස ප්‍රකාශ කිරීම.
4. නව පරීක්ෂණ මගින් කල්පිත පිරික්සීම
5. පසුව කරන නිරීක්ෂණ වලින් කල්පිතය තවදුරටත් තහවුරු වේ නම් එය වඩා නිවැරදිව අළුතින් ප්‍රකාශයට පත් කිරීම.

දැනුම ලබා දෙන කල්පිත - නිගමන ක්‍රමයට ඉමක් නැත. ඊයේ නිවැරදි ලෙස ගැණුනු මතය අද හෝ හෙට හෝ වැරදි යැයි ඔප්පු වන බව විද්‍යාඥයෝ කලෙක සිටම දනිති. අද හරියැයි දන්නා දේ හෙට වැරදියැයි මේ ක්‍රමයෙන්ම පසක් කරනු ඇත. ඒ නිසා හැම විටම තමා දැන ගත් දේ ගැන අවධානයෙන් සිටිය යුතුය. තමන් ලත් දැනුම ගැන විමසිල්ලෙන් සිටිය යුතුය. එවිට එහි වෙනසක් වුවහොත් වහාම දැන ගෙන තමන් සතු දැනුම යාවත්කාලීන කර ගත හැකිය.

විද්‍යා ලේඛකයකුද දැනුම බෙදා දීමේදී මේ ක්‍රමයම අනුගමනය කළහොත් එය තම අරමුණ සාර්ථක කර ගැනීමට හොඳ මගක් වෙතැයි සිතමි. විද්‍යා ලේඛකයා ද විද්‍යාඥයා මෙන් ම තම දැනුම අලුත් කර ගනිමින්, යාවත්කාලීන කර ගනිමින්, තම ලේඛක දිවිය පවත්වා ගෙන යා යුතු වෙයි. ඒ සඳහා ඔහුට තමාට ම ආවේනික වූ ශෛලියකුත් නිරවුල් බසකුත් අවශ්‍යය.

## නිරවුල් බසක වැදගත්කම

යම් අදහසක් නිරවුල් ව පැවසීමට හැක්කේ සන්නිවේදකයා වදන් හැසිරවීමේ දී ඒවා නිවැරදිව භාවිත කළහොත් පමණි. ඒ සඳහා ඉතා හොඳ උදාහරණයක් **ඊලියන් ද සිල්වා සූරීන්** විසින් වරෙක දක්වා ඇත. එය දිනය සඳහන් කිරීමේ දී අද බොහෝ දිනපතා පුවත්පත් කතුවරුන් කරන වරදක් පෙන්වා දීමෙකි. එය එතුමන්ගේ වදනින්ම ගෙන දැක්වුවහොත් මෙසේය. 'ජනවාරි 4 වැනි ද බදද' දිනයක් නම්, බොහෝ දෙනා එය හඟවන්නේ 'ජනවාරි 4 වන බදද' යනුවෙනුයි. ජනවාරි මාසයෙහි බදද දිනයන් හතරක් තිබුණ ද ජනවාරි මස 4 වන දින බදද දිනයක්ම විය යුතු නෑ., 'මසෙකෑ 4 වන ද බදද' කියන්නේ එකෙක්,' මසෙක 4 වන බදද' කියන්නේ වෙනස් මෑ දෙයක්. පිරිසිදු වැ, නිරවුල් වැ, අදහස් පැවසීම සිල්පයෙහි දී නම් ඉතා වැදගත්" (සිංහළ සිප්යුරු වදන් - 1, 18 පිට).

"එයට පසුව ඉග්නේෂන් සුවිච් එක යොදා ඇම්මීටර් එකේ කටුව ඩිස්චාර්ජ් නම් පැත්තට හරවා තිබේද කියා සහ රෙඩ් වෝනින් ලයිට් නම් රතු ලයිට් පත්තුවේ ද කියාත් බැලිය යුතුය. එය නිශ්චලව තිබේ නම් ඉන් එහි හෝ කොයිල් එකේ හෝ ඩිස්ට්‍රිබියුටර් බොක්ස් එක තුළ පිහිටි කොන්ඩෙන්සර් එකට ජොයින්ට් වී ඇති වයර් වලින් එකක් ලූස් වී තිබෙන බවයි". මේ උපුටනයෙන් දැක්වෙන්නේ කෙලින්ම ඉංග්‍රීසි වදන් සිංහලෙන් ගෙන තාක්‍ෂණික කරුණක් ගැන යම් අදහසක් පළ කරන්ට තැත් කළ සැටියි. මෙහිදී එය නිසි ලෙස ඉටු වන්නේදැ යි සලකා බැලීම වටී. මේ වදන් එම තාක්‍ෂණයේ නියුතු වූවන් හොඳින් හඳුනන හෙයින් මෙසේ වදන් ඉංග්‍රීසියෙන් ගෙන සිංහලෙන් ලියා දැක්වීම වරදක් නොවේ යැයි කෙනෙකු තර්ක කරන්නටද ඉඩ ඇත. එහෙත් පැරණි තාක්‍ෂණයක් හා සිප්ලකුවක් (Technology) ඇති එසේම හොඳ නැම්යාවක් සහිත බස් වහරක් ඇති සිංහලයෙන් එය නොකිරීම සිංහලයට කරන මදිපුංචි කමකි.

මෙවැනි අවස්ථාවක දී ලේඛකයා තමන්ගේ විෂයයට අදාළ පාරිභාෂික වදන් ගැන හොඳින් දැන සිටිය යුතුය. ඒ සඳහා පාරිභාෂික ශබ්දමාලා ඒ ඒ විෂයයට අදාළ ව නිකුත් කර තිබේ. ඇතැම් විටෙක එකම විෂයයක දී එකම දෙයකට පාරිභාෂික වදන් දෙකක් ද තිබිය හැකිය. එවන් විටෙක තම කාර්යය සඳහා වඩාත් සුදුසු වදන තෝරා ගැනීමේ හැකියාව ලේඛකයා සතුව තිබිය යුතුය. ඔහුගේ අත පොවන හරියේ හොඳ විද්‍යා ශබ්ද කෝෂයක් තිබිය යුතුය. ලේඛකයා සිංහලෙන් විද්‍යාව ලියන්නෙකු නම් සිංහලෙන් පළවූ විද්‍යා ශබ්දකෝෂයක් තිබිය යුතුය. (දැනට පළ වී ඇති **ආචාර්ය හරිශ්චන්ද්‍ර විජයතුංග ගේ "නූතන සිංහල පාරිභාෂික ශබ්දකෝෂය"**[8] මෙහි දී වඩාත් ප්‍රයෝජනවත් ය.)

ඇතැම් විට විද්‍යා සන්නිවේදකයාට තමන්ගේ ලිපිය සඳහා අවශ්‍ය වන වදනක් ලිපිය ලියන මොහොතේදීමත් සාද ගැනීමට සිදුවෙයි. එවැනි සෑම විටෙක ම සිප්යුරු වදන් තැනීමේ නිපුණයකු සොයා යාම කළ නොහැකියි. එසේම නිපුණයෙකු සොයා ගියත් තමන්ට අවශ්‍ය ඉක්මනට වදන සකසා ගැනීම කළ නොහැකි වෙයි. එවැනි විටෙක වදන තැනීමේ කාරිය වදන් සකසුවනට හෝ බස්වඩුවනට ම හෝ බාර නොකොට තමන්ට අවශ්‍ය පරිදි තම කටයුතු සන්නිවේදනයට සුදුසු වදනක් තනාගෙන තම කටයුත්ත කරගෙන යාමේ හැකියාව ඔහුට තිබිය යුතුය.

නැම්යාවක් ඇති සිප් වදනක් තනා ගැනීමට මග පෙන්වන පොතක් වරලත් උවදෙසු ඉංජිනේරු **ජලියන් ද සිල්වා සූරීන්** විසින් ලියා තිබේ. **"සිංහළ සිප්යුරු වදන්"** නම් වූ එම පොතෙහි මෙසේ සඳහන් වෙයි. "යම්කිසි ශිල්පයක් වැඩෙහි යෙදවෙන හැටි විස්තර කරන්නේ නම්, හෙවත්, ඒ ශිල්පයෙහි ලක්‍ෂණ දැක්වෙන්නේ නම්, එය සිප්ලකුව ලෙසින් හැඳින්වෙනවා. එය ඉංග්‍රීසියෙන් හඳුන්වන්නේ ටෙක්නොලොජි (Technology) යනුවෙනුයි. සිප්ලකුව දියුණුවෙන කලැ, රටද එමගින්ම දියුණු වෙනවා. එහෙත් සිප්ලකුව දියුණු වන්නට නම් සුදුසුතර සිප්ලකු බසක් අප පිහිටුවා ගත යුතුයි. එවන් බසෙකැ, වියැ යුතු වෙසෙසි ඉරියව් නම්, නිරවුල් වියරණයක් ද අරුත්වත්, නැම්යාවෙන් හෙබි, කෙටි, ඉසරි, සිප්යුරු වදන් වැළක් ද තිබීමයි".

වියත් ලෙස රසවත්ව කරන විද්‍යා සන්නිවේදනය තුළින්, විද්‍යා දැනුම බෙදා දීමෙන්, දෙයාකාරයක සේවයක් සිදු වේ. එක් අතෙකින් හොඳ සන්නිවේදකයෝ බිහි වෙති. අනෙක් අතට දැනුම සාර්ථකව ලබා දීම නිසා විද්‍යා දැනුමෙන් පිරිපුන් පරපුරක් බිහි වෙයි. ඒ අතරින් අනාගත ලෝකය බබලවන විද්‍යාඥයන් පවා බිහි වීමට ඉඩ තිබේ. සන්නිවේදකයන් බිහි වීම තුළින් මේ තත්ත්වය තව තවත් වර්ධනය විය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. **විද්‍යාව - රූපිත ග්‍රන්ථාවලිය (රසායනය, භෞතිකය, නක්ෂත්‍රය) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1972** Macdon ald Illustrated Library - Science by Dr. J. Bronowski, Sri Gerald Barry, James Fisher, Sir Julian Huxley. **(සිංහල අනුවාදයේ සංස්කාරක : වජිරසේන සමරකෝන්, පරිවර්තකයෝ: දී.ග. සුමනසේකර, බී.එස්. මෙත්තානන්ද)**
2. Guide to Science 1 (The Physical Sciences by Isaac Asimov, 3pp)
3. Essays on Science by Isaac Asimov, The New American Library, 1964
4. Words of Science and the History Behind Them by Isaac Asimov, The New American Library, 1969
5. Asimov's Biographical Encycolopedia of Science and Techonolgy, by Isaac Asimov,Pan Books Ltd,London.
6. **විද්‍යාව - රූපිත ග්‍රන්ථාවලිය**
7. **සිංහළ සිප්යුරු වදන්** - 1(Sinhala Technical Terms - 1) **ජලියන් ද සිල්වා, මොඩන් පොත් සමාගම. 1999**
8. **නූතන සිංහල පාරිභාෂික ශබ්ද කෝෂය, ආචාර්ය හරිශ්චන්ද්‍ර විජයතුංග. ඇස්. ගොඩගේ සහෝදරයෝ. 1999.**

# විද්‍යා සන්නිවේදනයේදී යොදාගන්නා භාෂාව

ආචාර්ය උපාලි ඇම් සේනානායක

විද්‍යා සන්නිවේදනය කරන අංශ ගණනාවක් ඇත. මේවා එල්ල කරන විවිධ ජන කොට්ඨාශ ගැන මෙහිදී යම් අවධානයක් යොමු කළ යුතුය. පළ කරන සන්නිවේදන ලේඛන අතර සාමාන්‍ය එදිනෙද පුවත්පත්, සති අන්ත පුවත්පත්, වාර සගරා සහ විශේෂ නිල නිවේදන සගරා ආදිය නම් කළ හැක.

දිනපතා පුවත් පතක පළ කරන විද්‍යා සන්නිවේදන බොහෝ විට ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති ඒවා වෙයි. උදාහරණයක් වශයෙන් නව තාක්ෂණ ක්‍රමයකින් ආහාර කල් තබා ගන්නා ක්‍රමයක් විස්තර කිරීමේදී සන්නිවේදනය වඩාත් අවධාරණය කරන්නේ එහි ප්‍රවෘත්තිමය පැත්තටය. තාක්ෂණ ක්‍රමයේ මූලධර්ම, එය යොදා කල් තබා ගත හැකි ආහාර වර්ග, එම ආහාරවල රසය, වර්ණය, පෝෂණ ගුණ ආදිය සංරක්ෂණය කරන හැටි සහ එම ක්‍රමය නිසා සිදුවන සමාජ සේවය ආදිය එම දිනපතා පුවත් පතක, ඇතැම්විට විශේෂ තීරු ලිපියක විස්තර සපයනු ලබයි. පුවත් පත කියවන සාමාන්‍ය පාඨකයාට එම ප්‍රවෘත්තිය සෑහේ.

සති අන්ත පුවත් පතක එම ප්‍රවෘත්තියම පළ කරන්නේ නම් එහි විශේෂත්වය ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුය. විශේෂාංග ලියන ලේඛකයින් එබඳු පුවත්පත් වලට සේවය සපයනු ලබයි. මුලින්ම ප්‍රවෘත්තිමය වැදගත් කමක් දැක්වූ එම ප්‍රවෘත්තිය සති අන්ත පුවත් පතක පළ කරන විට වඩාත් විස්තරාත්මක වනු ඇත. එබඳු ලිපි කියවීම පමණක් නොව, ලිපි එකතු කරන පාඨකයින්ද ඇත.

කලින් සඳහන් කළ ආහාර කල් තබා ගන්නා ක්‍රමය විස්තර කිරීමේදී එම තාක්ෂණ ක්‍රමය ගැඹුරින් විස්තර කළ යුතුය. එම මූලධර්ම වලට අමතරව, එම සොයා ගැනීමෙන් මිනිස් සමාජයට සිදුවන මෙහෙවර ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. මේවා විස්තර කිරීමේදී සරල භාෂාව වෙනුවට, විශේෂ පාරිභාෂික වචන ඇතුලත් භාෂාවක් යොදා ගත යුතුය.

පාඨකයින් අතරේ විවිධ වයස් මට්ටම්වල මෙන්ම බුද්ධි මට්ටම්වල පාඨකයෝ සිටිති. මේ අතර, ළමා, පාසැල් සිසුහු, විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සිසුහු, ගුරුවරු සහ උසස් විද්වතුන් ද සිටිති. මේ නිසාම එබඳු ජන කොටස් සඳහා ඉලක්ක කර ගත් විශේෂ පුවත්පත් සගරා ඇත.

පාසැල් ළමුහු අද අවධානය ලබන විශේෂ කොටසක් වෙති. මෙබඳු සිසුන් සඳහා විශේෂයෙන් ඉලක්ක කර ගත් විද්‍යා පුවත්පත් සහ මාසික සගරා වෙයි. මේවා විස්තර කිරීමේ දී ළමුන්ට තේරෙන සරල බසක් යොදා ගත යුතුය. මෙහිදී භාෂා විලාසයට අමතරව විද්‍යාත්මක සොයා ගැනීම් සහ එබඳු සන්නිවේදන සඳහා විශේෂ රූප සටහන්ද යොදා ගත යුතුය.

යෞවන වයසේ පසුවන විශේෂ පාඨක කාණ්ඩයක්ද වෙයි. එය ඕනෑම සමාජයක වෙසෙන තරුණ තරුණියන්ය. මේ අය අතර රැකියා කරන අය මෙන්ම රැකියා නොකරන අයද වෙති. එක් අතකින් මෙම කණ්ඩායම විශේෂ දැනුම සොයන කණ්ඩායමකි. එතරම් සරලත් නොවන, ගැඹුරුත් නොවන භාෂා විලාශයක් මේ අය සඳහා යොදා ගත යුතුය. තරුණ තරුණියන් වඩාත් ප්‍රිය කරන අංශ කීපයක් ගැන මෙහිදී අවධානය යොමු කළ යුතුය. බොහෝ තරුණියෝ රූපලාවන්‍ය, විලාසිතා, ආහාර පිසින ක්‍රම, සහ සෞඛ්‍යමය අංශ කෙරෙහි වැඩි ඇල්මක් දක්වති. මෙම ක්ෂේත්‍ර විස්තර කරන විශේෂාංග බොහෝ සති අන්ත පුවත් පත්වල සහ වාර සගරාවල ඇත. තරුණයන් වැඩියෙන් ආශා කරන්නේ තාක්ෂණ ක්‍රම කෙරෙහිය. එය මොටෝරිය, විදුලි කාර්මික, ගුවන්විදුලි රූපවාහිනී ශිල්පීය ක්‍රම විය හැක.

විද්‍යා සන්නිවේදනය කරන වෘත්තිමය සගරා සහ පළ කිරීම් ඇත. මේවාට ලිපි සැපයීමට පුහුණු කරන ලද විද්‍යා ලේඛකයින් ඇත. මේ අය ප්‍රධාන කාර්යයන් දෙකක් කරති. අදාල විද්‍යාඥයින් හෝ තාක්ෂණිකඥයින් සමග සාකච්ඡා

කර එම විස්තර සංවාදයක් හෝ ලිපියක් වශයෙන් ඉදිරිපත් කරති. මෙලෙස සපයන ලිපි වල භාෂාව ඉහල මට්ටමක ඇත. පර්යේෂණය කරන ලද හෝ තාක්ෂණය දියුණු කරන ලද පර්යේෂකයින් විසින්ම කෙලින්ම ලිපි සහ විස්තර සපයන අවස්ථා ඇත. මෙබඳු ලිපි බොහෝ විට පළ කරනු ලබන්නේ ඒවා යම් සංස්කරණයකට ලක් කිරීමෙන් පසුවය. අද ලොව වටා විවිධ භාෂා වලින් පළ කරන Discover, New Scientist සහ Readers Digest වැනි සඟරා මේ අංශයට වැටෙන සඟරා වෙයි.

Discover සඟරාව මෑතකදී තණ කොල වැඩීම පිළිබඳව ලිපියක මෙලෙස විස්තර කර තිබුණි. "වෙනත් ශාක පත්‍ර මෙන් නොව තණ පත්‍ර වැඩෙන්නේ එහි පතුලිනි. පත්‍රයේ අගින් නොවේ. යන්ත්‍රයකින් කැපූ පසු හෝ සතෙක් අනුභව කළ පසු ඒවා පහසුවෙන් වැඩෙන්නේ මේ නිසාය. තණ කොල කපන පළමු යන්ත්‍රය එංගලන්තයේ පේටන්ට් කරන ලද්දේ 1830 ගණන් වලය. ඊට පෙර තණ බිම් වැඩීම පාලනය කිරීමට බැටළුවන් ඒ තණ බිමේ තණ කෑමට සලස්වන ලදී".

මෙබඳු සරල භාෂාවක් යෙදීමෙන් විද්‍යා අධ්‍යාපනයක් ලද හෝ නොලද තැනැත්තෙකුට එම ලිපි කියවා තේරුම් ගැනීමට හැකි වෙයි. විද්‍යා සන්නිවේදනයේ දී සරල භාෂාවත්, නිවැරදි අරුත් යෙදීමත් ඉතාම වැදගත් වේ. ලෝ පතල වාර සඟරාවන TIME, NEWS WEEK වැනි සඟරා ගැඹුරු විද්‍යා සංකල්ප හෝ තාක්ෂණ ක්‍රම පොදු ජනයා වෙත සරලව, තේරෙන බසින් ඉදිරිපත් කිරීම ගැන ප්‍රසිද්ධියක් උසුලයි. කියවීම සහ ශ්‍රවණයේ වැදගත් වෙනසක් වන්නේ, තමා කියවන දේ නොතේරේ නම්, පාඨකයා තවදුරටත් එය නොකියවයි. ශ්‍රවණය කරන විට එය නොතේරුණත්, එය අසා සිටිය හැක.

විද්‍යා සන්නිවේදනය කරන තවත් විශේෂ සඟරා ඇත. මේවා විද්‍යා විෂයයන් සඳහා වෙන්වී ඇත. ආහාර තාක්ෂණ සඟරාව (Journal of Food Technology), රසායන විද්‍යා සඟරාව (Journal of Chemistry), ශාක රසායන විද්‍යාව (Journal of Phytochemistry) උදාහරණ ලෙස දැක්විය හැකිය. මෙබඳු සඟරාවල පළ කෙරෙන ලිපි බොහෝ විට නව සොයාගැනීම් මත පදනම් වෙයි. ඒවා ලියන පිළිවෙලක් ඇත. ලිපිය ලියන්නේ අළුත් පර්යේෂණයකින් ලද ප්‍රතිඵල විස්තර කිරීම සඳහාය. ලේඛකයා පර්යේෂණය සිදු කළ තැනැත්තාම වෙයි. පර්යේෂණයේ අරමුණ, ඒ සඳහා යොදගත් ශිල්පීය ක්‍රමය, කිරීමට යොද ගන්නා අමු ද්‍රව්‍ය, පර්යේෂණයෙන් ලද ප්‍රතිඵල, එහි සම්පිණ්ඩනය සහ නිගමන ආදී ලෙස එම පර්යේෂණ ලිපි ලියා ඇත. මෙබඳු මාසික, ත්‍රෛමාසික හෝ අර්ධ වාර්ෂික සඟරා වඩාත්ම අදාල වන්නේ එම ක්ෂේත්‍ර වල වැඩ කරන පර්යේෂකයින් සඳහාය. එසේ වුවත් එම පර්යේෂණ තොරතුරු සරල බසින් ලිඛිත මාධ්‍ය කරා ගෙන යා යුත්තේ සාමාන්‍ය විද්‍යා සන්නිවේදකයාය. එහෙයින් එම තැනැත්තන් ඒ ඒ විෂයය පිළිබඳ දැනුමක් තිබීම පමණක් නොව එම පර්යේෂණ පළ කිරීම් කියවා තේරුම් ගෙන ඒවා සාමාන්‍ය පාඨකයා වෙත ගෙන යෑමට සුදුසු භාෂා ගුණයක්ද තිබිය යුතුය. බොහෝ විට පර්යේෂණ දත්ත හෝ තාක්ෂණ ක්‍රම පළමුවෙන් පළ කරන්නේ එම විෂයට අදල ශාස්ත්‍රීය සඟරාවකය. එය සාමාන්‍ය පාඨකයා වෙත ගෙන යා යුත්තේ විද්‍යා සන්නිවේදකයා විසිනි.

# විද්‍යා සන්නිවේදනයේදී යොදාගන්නා භාෂාව

**ආචාර්ය උපාලි ඇම් සේනානායක**

විද්‍යා සන්නිවේදනය කරන අංශ ගණනාවක් ඇත. මේවා එල්ල කරන විවිධ ජන කොට්ඨාශ ගැන මෙහිදී යම් අවධානයක් යොමු කළ යුතුය. පළ කරන සන්නිවේදන ලේඛන අතර සාමාන්‍ය එදිනෙදා පුවත්පත්, සති අන්ත පුවත්පත්, වාර සඟරා සහ විශේෂ නිල නිවේදන සඟරා ආදිය නම් කළ හැක.

දිනපතා පුවත් පතක පළ කරන විද්‍යා සන්නිවේදන බොහෝ විට ප්‍රවෘත්තිමය වටිනාකමක් ඇති ඒවා වෙයි. උදාහරණයක් වශයෙන් නව තාක්ෂණ ක්‍රමයකින් ආහාර කල් තබා ගන්නා ක්‍රමයක් විස්තර කිරීමේදී සන්නිවේදනය වඩාත් අවධාරණය කරන්නේ එහි ප්‍රවෘත්තිමය පැත්තටය. තාක්ෂණ ක්‍රමයේ මූලධර්ම, එය යොදා කල් තබා ගත හැකි ආහාර වර්ග, එම ආහාරවල රසය, වර්ණය, පෝෂණ ගුණ ආදිය සංරක්ෂණය කරන හැටි සහ එම ක්‍රමය නිසා සිදුවන සමාජ සේවය ආදිය එම දිනපතා පුවත් පතක, ඇතැම්විට විශේෂ තීරු ලිපියක විස්තර සපයනු ලබයි. පුවත් පත කියවන සාමාන්‍ය පාඨකයාට එම ප්‍රවෘත්තිය සෑහේ.

සති අන්ත පුවත් පතක එම ප්‍රවෘත්තියම පළ කරන්නේ නම් එහි විශේෂත්වය ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුය. විශේෂාංග ලියන ලේඛකයින් එබඳු පුවත්පත් වලට සේවය සපයනු ලබයි. මුලින්ම ප්‍රවෘත්තිමය වැදගත් කමක් දැක්වූ එම ප්‍රවෘත්තිය සති අන්ත පුවත් පතක පළ කරන විට වඩාත් විස්තරාත්මක වනු ඇත. එබඳු ලිපි කියවීම පමණක් නොව, ලිපි එකතු කරන පාඨකයින්ද ඇත.

කලින් සඳහන් කළ ආහාර කල් තබා ගන්නා ක්‍රමය විස්තර කිරීමේදී එම තාක්ෂණ ක්‍රමය ගැඹුරින් විස්තර කළ යුතුය. එම මූලධර්ම වලට අමතරව, එම සොයා ගැනීමෙන් මිනිස් සමාජයට සිදුවන මෙහෙවර ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. මේවා විස්තර කිරීමේදී සරල භාෂාව වෙනුවට, විශේෂ පරිභාෂික වචන ඇතුලත් භාෂාවක් යොදා ගත යුතුය.

පාඨකයින් අතරේ විවිධ වයස් මට්ටම්වල මෙන්ම බුද්ධි මට්ටම්වල පාඨකයෝ සිටිති. මේ අතර, උදා. පාසැල් සිසුහු, විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සිසුහු, ගුරුවරු සහ උසස් විද්වතුන් ද සිටිති. මේ නිසාම එබඳු ජන කොටස් සඳහා ඉලක්ක කර ගත් විශේෂ පුවත්පත් සඟරා ඇත.

පාසැල් ළමුහු අද අවධානය ලබන විශේෂ කොටසක් වෙති. මෙබඳු සිසුන් සඳහා විශේෂයෙන් ඉලක්ක කර ගත් විද්‍යා පුවත්පත් සහ මාසික සඟරා වෙයි. මේවා විස්තර කිරීමේ දී ළමුන්ට තේරෙන සරල බසක් යොදා ගත යුතුය. මෙහිදී භාෂා විලාසයට අමතරව විද්‍යාත්මක සොයා ගැනීම් සහ එබඳු සන්නිවේදන සඳහා විශේෂ රූප සටහන්ද යොදා ගත යුතුය.

යෞවන වයසේ පසුවන විශේෂ පාඨක කාණ්ඩයක්ද වෙයි. එය ඕනෑම සමාජයක වෙසෙන තරුණ තරුණියන්ය. මේ අය අතර රැකියා කරන අය මෙන්ම රැකියා නොකරන අයද වෙති. එක් අතකින් මෙම කණ්ඩායම විශේෂ දැනුම සොයන කණ්ඩායමකි. එතරම් සරලත් නොවන, ගැඹුරුත් නොවන භාෂා විලාශයක් මේ අය සඳහා යොදා ගත යුතුය. තරුණ තරුණියන් වඩාත් ප්‍රිය කරන අංශ කීපයක් ගැන මෙහිදී අවධානය යොමු කළ යුතුය. බොහෝ තරුණියෝ රූපලාවන්‍ය, විලාසිතා, ආහාර පිසින ක්‍රම, සහ සෞඛ්‍යමය අංශ කෙරෙහි වැඩි ඇල්මක් දක්වති. මෙම ක්ෂේත්‍ර විස්තර කරන විශේෂාංග බොහෝ සති අන්ත පුවත් පත්වල සහ වාර සඟරාවල ඇත. තරුණයන් වැඩියෙන් ආශා කරන්නේ තාක්ෂණ ක්‍රම කෙරෙහිය. එය මොටෝරිය, විදුලි කාර්මික, ගුවන්විදුලි රූපවාහිනී ශිල්පීය ක්‍රම විය හැක.

විද්‍යා සන්නිවේදනය කරන වෘත්තීමය සඟරා සහ පළ කිරීම් ඇත. මේවාට ලිපි සැපයීමට පුහුණු කරන ලද විද්‍යා ලේඛකයින් ඇත. මේ අය ප්‍රධාන කාර්යයන් දෙකක් කරති. අදාල විද්‍යාඥයින් හෝ තාක්ෂණිකඥයින් සමග සාකච්ඡා

කර එම විස්තර සංවාදයක් හෝ ලිපියක් වශයෙන් ඉදිරිපත් කරති. මෙලෙස සපයන ලිපි වල භාෂාව ඉහල මට්ටමක ඇත. පර්යේෂණය කරන ලද හෝ තාක්ෂණය දියුණු කරන ලද පර්යේෂකයින් විසින්ම කෙලින්ම ලිපි සහ විස්තර සපයන අවස්ථා ඇත. මෙබඳු ලිපි බොහෝ විට පළ කරනු ලබන්නේ ඒවා යම් සංස්කරණයකට ලක් කිරීමෙන් පසුවය. අද ලොව වටා විවිධ භාෂා වලින් පළ කරන Discover, New Scientist සහ Readers Digest වැනි සඟරා මේ අංශයට වැටෙන සඟරා වෙයි.

Discover සඟරාව මෑතකදී තණ කොල වැඩීම පිළිබඳව ලිපියක මෙලෙස විස්තර කර තිබුණි. "වෙනත් ශාක පත්‍ර මෙන් නොව තණ පත්‍ර වැඩෙන්නේ එහි පතුලිනි. පත්‍රයේ අගින් නොවේ. යන්ත්‍රයකින් කැපූ පසු හෝ සතෙක් අනුභව කළ පසු ඒවා පහසුවෙන් වැඩෙන්නේ මේ නිසාය. තණ කොල කපන පළමු යන්ත්‍රය එංගලන්තයේ පේටන්ට් කරන ලද්දේ 1830 ගණන් වලය. ඊට පෙර තණ බිම් වැඩීම පාලනය කිරීමට බැටළුවන් ඒ තණ බිමේ තණ කෑමට සලස්වන ලදී".

මෙබඳු සරල භාෂාවක් යෙදීමෙන් විද්‍යා අධ්‍යාපනයක් ලද හෝ නොලද තැනැත්තෙකුට එම ලිපි කියවා තේරුම් ගැනීමට හැකි වෙයි. විද්‍යා සන්නිවේදනයේ දී සරල භාෂාවත්, නිවැරදි අරුත් යෙදීමත් ඉතාම වැදගත් වේ. ලෝ පතල වාර සඟරාවන TIME, NEWS WEEK වැනි සඟරා ගැඹුරු විද්‍යා සංකල්ප හෝ තාක්ෂණ ක්‍රම පොදු ජනයා වෙත සරලව, තේරෙන බසින් ඉදිරිපත් කිරීම ගැන ප්‍රසිද්ධියක් උසුලයි. කියවීම සහ ශ්‍රවණයේ වැදගත් වෙනසක් වන්නේ, තමා කියවන දේ නොතේරේ නම්, පාඨකයා තවදුරටත් එය නොකියවයි. ශ්‍රවණය කරන විට එය නොතේරුණත්, එය අසා සිටිය හැක.

විද්‍යා සන්නිවේදනය කරන තවත් විශේෂ සඟරා ඇත. මේවා විද්‍යා විෂයයන් සඳහා වෙන්වී ඇත. ආහාර තාක්ෂණ සඟරාව (Journal of Food Technology), රසායන විද්‍යා සඟරාව (Journal of Chemistry), ශාක රසායන විද්‍යාව (Journal of Phytochemistry) උදහරණ ලෙස දැක්විය හැකිය. මෙබඳු සඟරාවල පළ කෙරෙන ලිපි බොහෝ විට නව සොයාගැනීම් මත පදනම් වෙයි. ඒවා ලියන පිළිවෙලක් ඇත. ලිපිය ලියන්නේ අළුත් පර්යේෂණයකින් ලද ප්‍රතිඵල විස්තර කිරීම සඳහාය. ලේඛකයා පර්යේෂණය සිදු කළ තැනැත්තාම වෙයි. පර්යේෂණයේ අරමුණ, ඒ සඳහා යොදගත් ශිල්පීය ක්‍රමය, කිරීමට යොද ගන්නා අමු ද්‍රව්‍ය, පර්යේෂණයෙන් ලද ප්‍රතිඵල, එහි සම්පිණ්ඩනය සහ නිගමන ආදී ලෙස එම පර්යේෂණ ලිපි ලියා ඇත. මෙබඳු මාසික, ත්‍රෛමාසික හෝ අර්ධ වාර්ෂික සඟරා වඩාත්ම අදල වන්නේ එම ක්ෂේත්‍ර වල වැඩ කරන පර්යේෂකයින් සඳහාය. එසේ වුවත් එම පර්යේෂණ තොරතුරු සරල බසින් ලිඛිත මාධ්‍ය කරා ගෙන යා යුත්තේ සාමාන්‍ය විද්‍යා සන්නිවේදකයාය. එහෙයින් එම තැනැත්තන් ඒ ඒ විෂයය පිළිබඳ දැනුමක් තිබීම පමණක් නොව එම පර්යේෂණ පළ කිරීම් කියවා තේරුම් ගෙන ඒවා සාමාන්‍ය පාඨකයා වෙත ගෙන යෑමට සුදුසු භාෂා ගුණයක්ද තිබිය යුතුය. බොහෝ විට පර්යේෂණ දත්ත හෝ තාක්ෂණ ක්‍රම පළමුවෙන් පළ කරන්නේ එම විෂයට අදල ශාස්ත්‍රීය සඟරාවකය. එය සාමාන්‍ය පාඨකයා වෙත ගෙන යා යුත්තේ විද්‍යා සන්නිවේදකයා විසිනි.

# නාට්‍යානුසාරයෙන් විද්‍යාව සන්නිවේදනය

සී. වරකාදෙණිය

නාට්‍ය හා රංගනය එකිනෙකට බැඳී ඇති, වින්දනාත්මක අත්දැකීම් ලබා දෙන, ජන හදට සමීප වූ මාධ්‍ය වේ. එබැවින් "විද්‍යාව විශේෂිත වූ අයට පමණක්ය" යන්න වෙනුවට "සැමට විද්‍යාව" යන්න ජනතාව අතරට ගෙන යා හැකි ප්‍රබලම සන්නිවේදන මාධ්‍යය නාට්‍ය බව අවිවාදයෙන්ම පිළිගත යුතුව ඇත.

සොබාදහම සමග ජීවත් වූ ආදිකාලීන මිනිසාගේ රංගනය මිථ්‍යා මත හා පදනම් වූ යකුන්, ප්‍රේතයින්, දෙවියන් ආදීන් පිදීමට පමණක් සීමා විය. පසුව බිහිවූ නාඩගම්, කෝලම්, වෙස් නැටුම් යනාදිය ප්‍රේක්ෂකයන්ට වින්දනාත්මක අත්දැකීම් ලබා දීමට සමත් විය. ජාතක කතා සමග ඉදිරියට ආ නාට්‍ය කලාව තුළින් බිහිවූ කුස පබාවතී, සිංහබාහු, කදවළලු, මනමේ වැනි නාට්‍ය සඳහා අද ද ප්‍රබල ඉල්ලුමක් ඇත. වේදිකා නාට්‍ය, වීදි නාට්‍ය, එළිමහන් රංගන, ටෙලි නාට්‍ය ආදී කුමන අයුරකින් ඉදිරිපත් වුවත් මිනිසාට වින්දනය හා දැනුම ලබා දෙන ප්‍රබලම මාධ්‍යය ලෙස ඉදිරියෙන්ම සිටින්නේ නාට්‍යයයි.

සන්නිවේදනය සඳහා නාට්‍යය යොදා ගැනීම තුළින් විද්‍යාව අර්ථවත් හා රසවත් ලෙස ප්‍රචලිත කළ හැක. මෙහිදී පළමුව පොදු ජාතික අරමුණු හා එම අරමුණු කරා යොමු කිරීමට අවශ්‍ය අධ්‍යාපනයෙන් අපේක්ෂිත නිපුණතා හොඳින් දැන ගත යුතුය. එසේම "පාසැල් විෂය මාලාව" එම නිපුණතා ලබා දීම සඳහා සකස් කොට ඇති මෙවලම් බවද අමතක නොකළ යුතුය.

අධ්‍යාපන පරමාර්ථ රටින් රටට වෙනස් වුවත් පොදු පරමාර්ථය වනුයේ යහපත් පුරවැසියෙකු බිහි කර ගැනීමයි. කාල්මාක්ස්ගේ දර්ශනය අනුව එය "කොමියුනිස්ට් සමාජයක් කරා යන සමාජවාදී මිනිසෙකු බිහි කිරීම" විය. ඇමරිකාවේ එය "විද්‍යාව හා තාක්ෂණ දියුණුව උපරිම ලබන කිසිම අයෙකුට දෙවැනි නොවන ප්‍රජාතන්ත්‍රවාදී මිනිසකු බිහි කිරීම" විය. එම පරමාර්ථ ඉටු වන පරිදි පන්ති කාමරවල විෂයයන් ඉගැන්වීම නිසා තම රටට අවශ්‍ය පුරවැසියන් බිහි කර ගැනීමෙන් එම රටවල් සංවර්ධනය වී ඇත. මහජන චීනයේ "රතු විශේෂඥයෙකු බිහි කිරීම" යන අධ්‍යාපන පරමාර්ථය බුද්ධිමතුන් වූ වැඩ කරන්නන් සහ වැඩ කරන්නා වූ බුද්ධිමතුන් බිහිකිරීමට සමත් වී ඇත.

අප රටෙහි එවැනි පොදු නිශ්චිත පරමාර්ථයක් නැති විය. පන්ති කාමරවල ක්‍රියාත්මක වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය රටෙහි ආර්ථික, සමාජීය අවස්ථාවන්ට ගැලපෙන නිර්මාණශීලී පුද්ගලයින් බිහි කිරීමට සමත් නොවීය.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක් තුළ ක්‍රියාත්මක වූ අධ්‍යාපනයේ පරමාර්ථය වූයේ ලෙයින් සහ වර්ණයෙන් ස්වදේශීය වූ ද චින්තනයෙන් හා සදාචාරයෙන් බ්‍රිතාන්‍ය වූ ද පුරවැසියන් බිහි කිරීමයි. එම පරමාර්ථ ඉටුවන පරිදි අධ්‍යාපනය ක්‍රියාත්මක වූ බවට එකල උගත්හු සාක්ෂි දරති. නිදහස් අධ්‍යාපනයෙන් බිහි වූ උගතුන්ට වඩා එකල උගතුන් චින්තනයෙන් හා සදාචාරයෙන් ඉදිරියෙන් සිටින බව අකමැත්තෙන් වුවද පිළිගැනීමට සිදු වේ.

අධ්‍යාපන පරමාර්ථ තුළ ශ්‍රේෂ්ඨ දර්ශනිකයන්ගේ හා අධ්‍යාපනඥයින්ගේ චින්තනයන් ගැබ්වී ඇත. **"අධ්‍යාපනය ජීවනයයි. ජීවත්වීමේ ක්‍රියාවලියයි"** යන **ජෝන් ඩූවිගේ** සංකල්පය හෝ **"හිස, අත, හදවත, යන තුනම අධ්‍යාපනයෙන් සංවර්ධනය විය යුතුයි"** යන **මහත්මා ගාන්ධිගේ** චින්තනය හෝ මෙතෙක් ක්‍රියාත්මක වූ අධ්‍යාපනය තුළ ගැබ්වී නැත. ජීවත්වීමේ ක්‍රියාවලිය නොදන්නා හිස පමණක් සංවර්ධනය වූ උගතුන් අප රට තුළ බහුලවී ඇත්තේ එහෙයිනි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කීප වරක් සිදු වුවද අප රට තුළ සම්ප්‍රදායික විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය එලෙසම ක්‍රියාත්මක වේ. ප්‍රසිද්ධ විභාග වලින් විශිෂ්ට ප්‍රතිඵල ලබා ගන්නා අයට ජනප්‍රිය පාසැල් වලට ඇතුළු වීම, ශිෂ්‍යත්ව දිනා ගැනීම, විශ්ව විද්‍යාලවලට ඇතුළු වීම, වාසිදායක රැකියා ලබා ගැනීම වැනි අවස්ථා උදාවීම එයට හේතුවයි.

නව අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ තුළින් ඉදිරිපත් කර ඇති පොදු අරමුණු කරා යොමු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීමට පාසැල් පද්ධතිය සමත් වේ නම්, විභාග කේන්ද්‍රීය

අධ්‍යාපනය නිසාම පැන නැගී ඇති විරැකියාව, උපාධිධාරීන්ගේ ප්‍රශ්න, තරුණ අසහනය වැනි ගැටළු යම් තරමකින් හෝ අඩු කළ හැකිය. එසේ වීමට නම් ගුරුවරුන් තුළ මෙන්ම, ප්‍රජාව තුළ ද ආකල්පමය වෙනසක් ඇති කළ යුතුවේ. නැතහොත් ඇගයීම්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් යන සියල්ල ඵල රහිත වනු ඇත.

**ඩෙලෝ** වාර්තාවෙහි සඳහන් පරිදි අධ්‍යාපනය දරා සිටින "ප්‍රධාන කුළුණු හතර" මෙසේ දැක්වෙයි.

- i දැනගැනීමට ඉගෙනීම
- ii වැඩ කිරීමට ඉගෙනීම
- iii එක්ව ජීවත්වීමට ඉගෙනීම
- iv ඉගෙනුමට ඉගෙනීම

විශ්ව අධ්‍යාපන අරමුණු වන මේවා ඉටුවන ලෙස සෑම රටකම අධ්‍යාපන ක්‍රමය සකස් කොට ඇත.

**"පූර්ණ මිනිසකු බිහි කිරීමේ අධ්‍යාශයෙන් කෙරෙන ශාරීරික, බුද්ධිමය, භාවාත්මක හා ගුණාත්මක සංකලනය අධ්‍යාපනයයි"** යන ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන පරමාර්ථ තුළ පූර්ණ මිනිසකු වීම සඳහා සංවර්ධනය විය යුතු අංශ ලෙස පහත සඳහන් හය පෙන්වා දී ඇත.

- i චිත්ත වේග
- ii සදාචාරාත්මක
- iii සමාජමය
- iv බුද්ධිමය
- v ශාරීරික
- vi සෞන්දර්යාත්මක

ඒ සඳහා ලබාදිය යුතු නිපුණතා ලෙස

1. සන්නිවේදනය - සාක්ෂරතාව, කල්පනා කිරීම , සවන්දීම, කථනය, කියවීම, ලිවීම

   ගණනය හා මානනය, ඉලක්කම් භාවිතය, අවකාශය, කාලය, ගණන් බැලීම

   රූපණය, චිත්‍ර, ප්‍රස්ථාර

2. පරිසරයට අදාළ - සමාජීය, ජීව විද්‍යාත්මක, භෞතික සම්බන්ධ ආකල්ප හා කුසලතා

3. ආගම, ආචාර ධර්මවලට අදාල සදාචාර වර්ධනය

4. ක්‍රීඩා හා විවේකය, සහයෝගය, කණ්ඩායම් එකතුව, සාධාරණ තරගය, ව්‍යායාම

5. ඉගෙනුමට - ඉගෙනීම
   යමක් ගැන දැන ගැනීමට හා දැනුම යාවත්කාලීන කිරීමට අවශ්‍ය වේ.

උසස් පෙළ ඉගෙනුම ලබන්නෝ නව යෞවන වියෙහි සිසුහු වෙති. සුරක්ෂිත බව, ස්වාධීනත්වය, කණ්ඩායම් ලැදියාව, ලිංගික ලැදියාව, ආදරය, පිළිගැනීම ට ලක්වීම වැනි අවශ්‍යතා ඔවුනට ඇත. විශේෂයෙන්ම විද්‍යාව හදාරන සිසුන් තුළ සැඟවී ඇති සහජ හැකියාව තුළින් නව නිර්මාණයන් රටට ඉදිරිපත් කළ හැක. එයට අවස්ථා සලසා දීම මගින් යොවුන් අවශ්‍යතා තමාටත් රටටත් හිතකර බලවේග බවට පත් කළ හැකිය. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් නිර්දේශිත ව්‍යාපෘති හා පැවරුම් මගින් මෙයට අවස්ථා සම්පාදනය කොට ඇත.

එම ව්‍යාපෘති හා පැවරුම් අතරට කේවළ ව්‍යාපෘතියක් ලෙස විද්‍යා නාට්‍ය පිටපතක් ලිවීමද, කණ්ඩායම් ව්‍යාපෘතියක් ලෙස නාට්‍යයක් ඉදිරිපත් කිරීමද ඇතුලත් කළහොත් නිපුණතා ලබා ගැනීමට අවශ්‍ය කුසලතා, දැනුම, ආකල්ප, වර්ධනය වේ. නාට්‍ය කලාව කෙරේ ලැදියාවක් දක්වන්නන් එම ව්‍යාපෘතිය තෝරා ගන්නා බැවින් ස්වයං පෙළඹීම තුළින් විෂය කරුණු වැඩිදුරටත් හදරයි. විවිධ මාධ්‍ය වලින් තොරතුරු ලබා ගනී. පරිකල්පනය හා නිර්මාණාත්මක හැකියාව වර්ධනය කරගනී.




**1 - රූපය**

නාට්‍යයක් ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කිරීමේ දී

- i කණ්ඩායම් එකතුවීම සිදුවේ
- ii සාමූහිකව පිටපත් කියවයි, සැලසුම් කරයි

iii සහජ හැකියාව අනුව චරිත බෙදා ගනී
iv විවේක කාල වල පුහුණු වෙයි
v බාහිර උදව් ලබා ගනී
vi විවේචන හා අන්‍ය අදහස් ගරු කරයි
vii සමාජය දෙස සුභවාදීව බලයි
viii ප්‍රේක්ෂකයින්ට ඉහළම නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වේ.

12.13 ශ්‍රේණිවල සිසුන්ගේ ව්‍යාපෘති තුළින් ඉටු වේ යයි අපේක්ෂිත අරමුණු අතරින් පහත සඳහන් ඒවා "නාට්‍යානුසාරයෙන් විද්‍යාව සන්නිවේදනය" ව්‍යාපෘතියට කෙළින්ම සම්බන්ධ වේ.

1. ලබාගත් දැනුම, කුසලතා භාවිතා කිරීමේ හැකියාව
2. ජීවිතයට අදාළ එලදායී ආකල්ප වැඩි දියුණු කිරීම
3. අන්‍ය අදහස් වලට සැලකීම, ගරු කිරීම
4. තම දැනුම් අත්දැකීම්, අදහස් අන් අයට තේරුම් ගත හැකි වන සේ පැහැදිලිව ප්‍රකාශ කිරීමේ හැකියාව

13 ශ්‍රේණියෙන් පසු ශිෂ්‍යයා සමාජයට පා තබන පුරවැසියෙක් වේ. ඔහු ලත් නිපුණතා මගින් විද්‍යාත්මක චින්තනය සමාජයට ද සම්ප්‍රේෂණය වේ.

විද්‍යාව සන්නිවේදනයට සම්පූර්ණ නාට්‍ය යැදීම අවශ්‍ය නැත. ඒ සඳහා පහත සඳහන් අවශ්‍යතා යොදා ගත හැක.




2 - රූපය

i චරිතාංග රංගන - ශාකයක්, සතෙක්, ශරීරයක කොටසක් වැනි දෙයකට ආරෝපණය වී විෂය කරුණු ඉදිරිපත් කිරීම.

ii දෙබස් - දෙබස් රසවත්ව ඉදිරිපත් කිරීම මගින් විෂය කරුණු ඉස්මතු කිරීම

iii විකට ජවනිකා - මූල ද්‍රව්‍ය එකතුවී සංයෝග සෑදීම, වාද විවාද මගින් සංකල්ප මතු කිරීම

iv නිර්මාණාත්මක නාට්‍ය - නාට්‍යයක් නිර්මාණය කොට පිටපත් මගින් පුහුණු කරවා ඉදිරිපත් කරන නාට්‍ය (සෞන්දර්යාත්මකව)

උසස් පෙළ ව්‍යාපෘති සඳහා "විද්‍යාව සන්නිවේදනයට නාට්‍ය" යොදා ගන්නේ නම් ඒ සඳහා යෝග්‍ය වන්නේ නිර්මාණාත්මක නාට්‍ය වේ. අනිත් ඒවා නාට්‍යානුසාර ක්‍රියාකාරකම්ය.

විෂය දැනුම තහවුරු කෙරෙන, විද්‍යාව ජීවිතයට සමීප කරන, ස්වයං ඉගෙනීමක් කරා යොමු කෙරෙන, ඉහත ව්‍යාපෘතියක් තුළින් සභෝකෝලය, හීනමානය, අධිමානය, සමාජ භීතිකාව වැනි චිත්තවේග ජය ගත හැක. හිතකර චිත්තවේග වර්ධනය කරගත හැක. එබැවින් සමාජය දෙස සුභවාදීව බැලිය හැකි යහපත් පුරවැසියන් බිහිවේ.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලින් අපේක්ෂිත රටේ සංවර්ධනයට ක්‍රියාශීලී දායකත්වයක් සැපයිය හැකි ජාතිය ගොඩනැංවීමේ කාර්යයට ඇපකැප විය හැකි පූර්ණ පෞරුෂයකින් හෙබි පුරවැසියන් බිහි කිරීමට ඉහත ව්‍යාපෘතිය දායක වේ. එවිට ඇතැම් උගතුන් අතර පවා පවතින අල්ලස, දූෂණය, වංචාව වැනි අහිතකර බලවේග අඩු වනු ඇත. උසස් අධ්‍යාපන ආයතනවල සිදුවන අමානුෂික නවක වධ වැනි ක්‍රියා ද අවම වනු ඇත. විද්‍යාත්මක චින්තනයකින් යුතුව සුභවාදීව සමාජය දෙස බලන පුරවැසියන් සිටින රටක් සංවර්ධනය කරා යොමු වීම නිතැතින්ම සිදුවනු ඇත.

# පොදු ජනතාව වෙත සෞඛ්‍ය සංනිවේදනය

**තුසිත මලලසේකර**

සෞඛ්‍යය ප්‍රවර්ධනය, මහජන සෞඛ්‍යය හා රෝගී සත්කාර සේවා යන මේ කවර සෞඛ්‍ය ක්ෂේත්‍රයකට වුව තොරතුරු ව්‍යාප්තිය අතිශයින්ම වැදගත් වෙයි. සෞඛ්‍ය ආශ්‍රිතව ජනතාව අතට පත්වන බොහෝ තොරතුරු ඔවුන්ට සමීප කරනුයේ ජනමාධ්‍යය. එහිදී මුද්‍රිත හා විද්‍යුත් යන මාධ්‍යයන් දෙපාර්ශවයම පෙරමුණේ වෙයි. "ඒඩ්ස්" හෝ "පිස්සු ගව රෝගය" වැනි නව වසංගත පිළිබඳව ,සලකා බැලුවද දුම්පානය, මත්පැන් පානය, අහිතකර ආහාර රටා, ව්‍යයාමයෙන් තොරවීම හා බැඳුන නූතන ශිෂ්ටාචාරය හෙවත් ජීවන රටාව හා සම්බන්ධ රෝග පිළිබඳව සලකා බැලුවද ජනමාධ්‍ය තොරතුරු වාහකයක් ලෙස සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරයි.

මහජනතාවගේ ඇසින් බලන විට මාධ්‍ය ඔස්සේ සෞඛ්‍යමය තොරතුරු හා දැනුම ව්‍යාප්තිය අතිශයින්ම වැදගත් වූ ප්‍රමුඛතාවයක් ලෙස පෙනේ. සෞඛ්‍ය සංනිවේදකයන් සහ මාධ්‍ය විසින් **ප්‍රතිශක්තිකරණ වැඩසටහන, පවුල් සැළසුම් වැඩසටහන** සහ **පෝෂණය නංවාලීමේ වැඩසටහන** ආදී සෞඛ්‍ය වැඩසටහන් වල සාර්ථකත්වය සඳහා ලබාදුන් දයකත්වය අතිමහත්ය. සෞඛ්‍ය පිළිබඳ තොරතුරු ජනතාව අත පත්කිරීමේ වගකීම දරන්නවුන් ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයින් මෙන්ම සෞඛ්‍ය සංනිවේදනයේ යෙදෙන ජනමාධ්‍යවේදීන් එම කාර්ය ඉටු කිරීමෙහි ලා තව තවත් වෙහෙසිය යුතුව ඇත. මෙහිදී සෞඛ්‍ය සංනිවේදකයින් සිත්හි රඳවා ගත යුතු වැදගත්ම කරුණ වනුයේ තමන් රචනා කරන්නේ වෘත්තීමය සඟරාවක පළ විය යුතු විද්‍යාත්මක ලිපියක් හෝ පර්යේෂණ තොරතුරු පත්‍රිකාවක් නොව තම පාඨකයන් හට කියවා තේරුම් ගත හැකි ලිහිල් ලිපියක් බවය. එමගින් අදළ තේමාව හෝ විෂය පිළිබඳ ඉතා ගැඹුරින් කරන විද්‍යාත්මක විමර්ශනයක් අපේක්ෂා නොකරන බව සංනිවේදකයන් දැන සිටීමත් අවශ්‍යය.

සෞඛ්‍ය සංනිවේදකයා විසින් තමන් එක් රැස් කර ගත් සියලු  තොරතුරු යළි මැන බැලිය යුතුය. එමගින් සිය පාඨකයන්ව ග්‍රහණය කර ගත හැක. ඔවුන්ට තේරුම් කර ගත හැකි වැදගත් කරුණු පමණක් තෝරා බේරා ගෙන ඒවා ව්‍යාප්තියට උත්සාහ දැරිය යුතුය. සංනිවේදන කුසලතා වලින් පරිපූර්ණ නොවූ සංනිවේදකයකු හට මෙම ක්‍රියාවලිය බෙහෙවින් අසීරු වීමට ඉඩ ඇති බව අප අමතක නොකළ යුතුය.

ඒ අතරම සෞඛ්‍ය පිළිබඳව කියවීමට, ඇසීමට, දැකීමට ජනතාව අතර තද පිපාසයක් තිබිය දී සෞඛ්‍ය පිළිබඳ තොරතුරු හා සෞඛ්‍ය සම්බන්ධව ලිවීම ද්විතියික වැදගත් කමක් පමණක් හිමි තත්වයක් ලෙස සලකන සංනිවේදකයන් දක්නට ලැබීම අරුමයකි. "වෛද්‍යමය" හා "සෞඛ්‍යමය" විෂයයන් "විශේෂිත" විෂයයන් ලෙස සමහර සංනිවේදකයන් බොහෝ විට සලකන නිසාත් ඒ කරුණු ජනතාව වෙනුවෙන් නිවැරදිව ලිවීම සඳහා තරම් දැනුවත් භාවයක් තමන් තුළ නොමැති බව සිතන නිසාත් එසේ වනවා විය හැකිය. මේ අතර වෛද්‍ය විශේෂඥයින් නිතර නගන මැසිවිල්ලක් වන්නේ ද තම ප්‍රකාශයන් නිවැරදි ලෙස ජනතාව අතට පත් කිරීමට මාධ්‍යවේදීන් අසමත් වන බවය. නැතහොත් සෞඛ්‍ය සංනිවේදකයන් තම පණිවුඩ වරදවා වාර්තා කරන බවකි.

සෞඛ්‍ය පිළිබඳ ලිපි සම්පාදනයට පෙරාතුව සෑම සෞඛ්‍ය සංනිවේදකයකුම අදල විෂය හා සම්බන්ධව තම අතට පත්වන සෑම සියලු දෙයක්ම කියවීම අතපසු නොකළ යුතුය. විශේෂඥයා සමග නියමිත සාකච්ඡාවට යන විට තමුන් ද "සුලු විශේෂඥයකු" බවට පත්ව යා හැකි නම් ඒ බොහෝ ප්‍රයෝජනවත් ය. එසේම අදල විෂය හා සම්බන්ධව විශේෂඥයා විසින් පළ කළ හැකි ජනතාවට ආගන්තුක වීමට ඉඩ ඇති වෛද්‍යමය හා තාක්ෂණමය වචන කවරක් විය හැකි ද? යන්න ගැන අවබෝධයක් ඇතිව සාකච්ජාවට යොමුවීමත් ප්‍රයෝජනවත්ය. එමගින් තමන් භාවිතා කිරීමට යන සරල වදන්වල නිවැරදි භාවය  විශේෂඥයා ඉදිරියේ දී තහවුරු කර ගැනීමේ අවස්ථාව උදවෙයි.

සෞඛ්‍ය සංනිවේදකයා සහ සෞඛ්‍ය විශේෂඥයා අතර යහපත් සම්බන්ධීකරණයක් සහ අන්‍යොන්‍ය අවබෝධයක් පැවතීම අතිශයින්ම වැදගත්ය. සමහර අවස්ථාවන්හි දී සෞඛ්‍ය සංනිවේදකයින් මෙම කරුණු ඉතා සැහැල්ලුවට ගන්නා අතර ඒ කෙරෙහි නිසි අවධානයක් යොමු නොකරයි. එමෙන්ම සෞඛ්‍ය විශේෂඥයා තුළ ද සෞඛ්‍ය සංනිවේදකයන් සිය කාර්යයන් සිදු කරන ආකාරය හා ඔවුන් ඉදිරියේ ඇති බාධා පිළිබඳවද අවබෝධයක් නොමැත. සාකච්ඡාවට ලක්වන තේමාව පිළිබඳව සෞඛ්‍ය සංනිවේදකයා තුළ ඇති දැනුම සීමිත බව සලකා ඔහුට හෝ ඇයට හෝ එය ඉතා හොඳින්, ඉවසිල්ලෙන් හා සරලව තේරුම් කර දීම සෞඛ්‍ය විශේෂඥයාගේ වගකීමකි. හැකි හැමවිටම වෛද්‍ය තාක්ෂණිකමය වචන භාවිතා නොකර පැහැදිලි සරළ භාෂාවෙන් සංනිවේදකයන්ට කරුණු වටහා දීම සිදු විය යුතුය. මේ අතර සෞඛ්‍ය සංනිවේදකයා තුළද තමන්ට නොවැටහෙන කරුණු ගැන නොපැකිල විමසමින් නිවැරදි ලෙස විෂය හා කරුණු වටහා ගැනීමේ උනන්දුවක් පැවතිය යුතුය.

සෞඛ්‍ය සංනිවේදකයා නිරතුරුවම ගම මතකයේ රඳවා ගත යුතු වැදගත්ම කරුණ වනුයේ තමන් මෙම ලිපිය රචනා කරනුයේ තම පාඨකයන් වෙත බවය. ඔවුන්ගේ එදිනෙද ජීවිතයට බලපාන වැදගත් හෝ අසීරු විෂයයන් තේරුම් බේරුම් කර ගැනීමට ඔවුන් සියලු බලාපොරොත්තු රඳවා ඇත්තේ තමන් වෙත බව ලේඛකයා දැන සිටිය යුතුය. එනිසා සම්මුඛ සාකච්ඡාවෙන් පසුවද, එම විෂය පිළිබඳව තව තවත් කරුණු හදරා, පත පොත කියවා, පාරිභාෂික ශබ්ද මාලා හා ශබ්ද කෝෂ යොදා ගනිමින් සිය ලිපිය හැකි තරම් සරළව හා පැහැදිලිව විස්තර කිරීමට උත්සාහ දැරිය යුතුය. සමහර අවස්ථාවන්හි දී පාරිභාෂිත වචන යොදා ගැනීම නොවැළැක්විය හැකි කරුණක් විය හැකිය. උදහරණයක් ලෙස විජලනය යන වචනය ගනිමු. ඒ වචනයත් සමග ඇග වියලී යාම යනුවෙන් අර්ථ පැහැදිලි කිරීමක් කළ හැකිය. නොඑසේ නම් උදුරා ගත් කුඩලු පැලෑටියක් ජලය නැතිව යන ආකාරය උදහරණයක් ලෙස දැක්විය හැකිය.

සමහර අවස්ථාවනිහිදී සෞඛ්‍ය විශේෂඥයින් සහ සෞඛ්‍ය සංනිවේදකයන් විරුද්ධ පැති දෙකක රැඳී සිටිනු දැකිය හැකිය. එනිසාම ඒ දෙපිරිසටම ඔවුනොවුන් තේරුම් ගැනීම අසීරුය. සෞඛ්‍ය විශේෂඥයින් බොහෝ විට අවධානය යොමු කරනුයේ දීර්ඝ කාලීන, ගැඹුරින් විග්‍රහ කළ හැකි කරුණු කෙරෙහිය. එහෙත් සංනිවේදකයින් ඉක්මණින් ක්‍රියාත්මක විය යුතුය. එසේම සරල හා ආසන්න ලෙස විචිත්‍රකරණයෙන් යුතු යමක් ඉදිරිපත් කිරීම ඔවුන්ගේ උත්සාහයයි.

අද වර්තමාන අවශ්‍යතාවයව පවතිනුයේ සෞඛ්‍ය විශේෂඥයින් සහ සෞඛ්‍ය සංනිවේදකයන් එක්තරා පොදු ස්ථානයකට අන්‍යොන්‍ය අවබෝධයකින් යුතුව යොමු කිරීමය. සෞඛ්‍යය ප්‍රවර්ධනය කළ හැකි වනුයේ ජනතාව ඒ කෙරෙහි පූර්ණ ලෙස දැනුවත් කිරීම තුළින් පමණක් බව සෞඛ්‍ය විශේෂඥයින් දැන සිටිය යුතුය. සත්‍ය වශයෙන්ම නම් සෞඛ්‍ය තොරතුරු ලෙස ජනතාව වෙත ඉදිරිපත් කළ යුත්තේ පෝෂණය හෝ ආහාර වේල හෝ ස්වස්ථතාවය හෝ පිළිබඳ පැරණි පණිවිඩ පමණක් නොවේ. මේ සංනිවේදන උත්සාහයන් යොමු විය යුත්තේ සෞඛ්‍ය පිළිබඳ මූලික දැනුම් සම්භාරයක් ජනතාව තුළ තැන්පත් කිරීමේ පරම අභිලාශයෙනි. එමගින් ප්‍රජාවට සිය සෞඛ්‍යය ප්‍රවර්ධනය කර ගැනීමට වඩාත් වැදගත් වනවා සහ සහාය වනවා පමණක් නොව අහිතකර හුරු පුරුදු වලින් ඈත් වීමට ද ඉඩකඩ සලසයි. එපමණක් නොව වර්තමානයේ අප මුහුණ දෙන ප්‍රධාන සෞඛ්‍ය ගැටළු පිළිබඳ වඩාත් හොඳින් අවබෝධයක් ලබා ගැනීමටත්, එම සෞඛ්‍ය ගැටළු මර්දනය සඳහා දරන වෑයම් කෙරෙහි ජනතා සහාය වැඩිපුර ලබා ගැනීමේ අවස්ථාව උදකර දීමටත් එය සමත් වනවා නිසැකය.

VIDUS 21-1-17

# විද්‍යා සන්නිවේදනය පිළිබඳ සඟරා

**ආචාර්ය ඩබ්ලිව්.ආර්. බ්‍රෙකෙන්රිජ්**

විද්‍යාත්මක පර්යේෂණ යනු සමාජීය හෝ සාමූහික ක්‍රියාකාරකමකි. එය කරනු ලබන්නේ පෞද්ගලික වශයෙන් හෝ කණ්ඩායමක් වශයෙනි. විද්‍යාත්මක පර්යේෂණ සිදු වන්නේ "පුළුල් සමාජීය සහ ඓතිහාසික සම්බන්ධතාවක්" ඇතිවය. මෙම ක්‍රියාවට ආවේනික සහ එහි පැවැත්මට අත්‍යාවශ්‍ය වන්නේ සන්නිවේදනයයි. විද්‍යාවේ ප්‍රගතිය සඳහා විද්‍යාත්මක සොයා ගැනීම්, සිතිවිලි සහ අදහස් සන්නිවේදනය ඉතා වැදගත් වෙයි.

මුල් අවදියේ විද්‍යාත්මක සමාජවල වාර්තා, සාකච්ඡා, චක්‍රලේඛන ලිපි සහ ලියුම් යනාදිය තැපෑලෙන් පමණක් ලැබෙන්නට සලස්වන ලදී. මේවා පසුව වඩාත් ක්‍රමවත් හෝ විධිමත් ක්‍රම මගින් සන්නිවේදනය කරන ලදී. මේ හා සම්බන්ධ මුල්ම ඉංග්‍රීසි විද්‍යාත්මක සඟරාව දියත් කළේ 1665 දී ය. එය නමින් **රාජකීය සංගමයේ දර්ශන වාර්තා** ලෙස හඳුන්වන අතර, එය අද දක්වාම පළ කරනු ලැබේ.

ලොව පුරා අද විද්‍යාත්මක සඟරා 50,000 ක් පමණ පළ කරනු ලබන අතර, ඉන් 25,000 ක්ම ජීව වෛද්‍ය විද්‍යාව සඳහා වෙයි. සතිපතා පළ කරන **Current Contents** (ජීව විද්‍යා) පොත් පිංචෙහි ඉංග්‍රීසි සඟරා 1500 ක් පමණ ලැයිස්තු ගත කර ඇත. ශ්‍රී ලංකාව තුළ එබඳු සඟරා 50 ක් පමණ පළ කරන අතර, ඒවා ප්‍රධාන වශයෙන් පළ වන්නේ ඉංග්‍රීසි බසිනි. ඒ අතර පැරණිතම සඟරාව **"ලංකා විද්‍යා සඟරාව"** පළමුවෙන් 1942 දී පළ කරන ලද අතර, **Spolia Zeylanica** සඟරාව 1904 දී හෝ ඊට ආසන්නව දහනවවන සියවසේ මුල් කාලයේ දී කොළඹ කෞතුකාගාරය විසින් පළ කරන ලදී.

විද්‍යා සඟරා පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරයි. අද දැනුම් සම්භාරය ඉතා විශාලව ඇති හෙයින් බොහෝ සඟරා ඉතා පටු විශේෂඥ පරාසයක් ආවරණය කරනු ලබයි. පාඨකයින් විශාල සංඛ්‍යාවක් කියවන සඟරා ප්‍රමාණය අඩුය. පාඨකයින් විශාල සංඛ්‍යාවක් කියවන එබඳු සඟරා දෙකක් ඇත. එංගලන්තයේ පළ කරන **Nature** නම් සඟරාවත්, **Science** නම් ඇමරිකාවේ පළ කරන සඟරාවත් පුළුල් ප්‍රචාරයක් ලැබෙන, සතිපතා පළවෙන එබඳු සඟරා වෙයි. විශේෂඥ සඟරා පටු පරාසයක පාඨකයින් පිරිසක් කියවන අතර, එයට අදාළ ක්ෂේත්‍ර එම පාඨකයින්ට පමණක් සීමා වෙයි. බොහෝ සඟරා මාසිකව, ද්විමාසිකව හෝ මාස තුනකට වරක් පළ කරනු ලබන අතර, දායක මුදල් මගින් පමණක් ලබා ගත යුතුය.

සඟරාවක් පළ කිරීමේ දී , කර්තෘ කෙනෙක්, උප කර්තෘ කෙනෙක් සහ පළ කිරීමට පෙර ලිපි සමීක්ෂණයකට භාජනය කරන සමීක්ෂණ මණ්ඩලයක්ද ඇත. පළ කිරීමට භාර දීමේදී සෑම සඟරාවකටම ඊට ආවේනික නීතිරීති මාලාවක් ඇත. පළ කිරීම සඳහා බොහෝ ලිපිවලට ගාස්තුවක් අය නොකෙරේ. එසේ වුවත්, සඟරා ස්වල්ප සංඛ්‍යාවක, ලිපි පළ කිරීම සඳහා ගාස්තුවක් අය කෙරේ. පළ කිරීම, මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම වෙනම මණ්ඩලයක වගකීම වෙයි.

භාෂා ගණනාවකින් සඟරා පළ කරනු ලැබේ. ප්‍රධාන භාෂා වන ඉංග්‍රීසි, ප්‍රංශ, ස්පාඤ්ඤ, ජර්මානු, රුසියානු, චීන, ජපන් සහ ඉතාලි වැනි භාෂා මෙහිදී නම් කළ හැක. පුරාණයේ විද්‍යාවේ වැදගත් තැනක් ගත් අරාබි භාෂාව, උතුරු අප්‍රිකා සහ මැද පෙරදිග රටවල් තවමත් භාවිතා කරනු ලැබේ. විද්‍යාත්මක සොයා ගැනීම් විශාල වශයෙන් අද පළ කෙරෙන භාෂාව ලෙස ඉංග්‍රීසි බස තැනක් ගෙන ඇත. දැනට කාර්යයන්හි නියුතු විද්‍යාඥයින්ට ප්‍රංශ, ජර්මානු, රුසියානු, ජපන් හෝ චීන බස දැන ගැනීම විද්‍යාත්මක දේ දැන ගැනීමට අවශ්‍යම දෙයක් ලෙස නොසැලකෙයි. බොහෝ විද්‍යාඥයෝ තමාගේ පර්යේෂණ ප්‍රතිඵල ප්‍රසිද්ධ වීමට, පිළිගැනීමකට හා ඇගයීමකට ලක්වීමකට නම් ඒවා ඉංග්‍රීසියෙන් පළ කිරීම හෝ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සුදුසු යැයි විශ්වාස කරති.

සමහර හොඳ සහ මූලික වැඩ ඉංග්‍රීසියෙන් හැර අන් බසෙකින් වාර්තා කිරීම නිසා ඒවා අවාසනාවන්ත ලෙස නොසලකා හැරීමද එහි කතුවරයා සුදුසු ලෙස අගැයීමකට ලක්කිරීමට ප්‍රමාද වීමද සිදු විය හැක.

තෙවන ලෝකයේ යැයි කියන රටවල පළ කරනු ලබන බොහෝ සඟරා, පළමුවන රටවල පිළිගැනීමක් නොකළ ද, ප්‍රාදේශීය විද්‍යාත්මක සමාජයට ඒවා වැදගත් මෙහෙයක් ඉටු කරයි. දේශීය හෝ ප්‍රාදේශීය සඟරා එම රටවල් තුළම පිළිගැනීමකට ලක් කිරීම වැදගත් වන අතර විද්‍යාත්මක වශයෙන් අන්තර්ගත කරුණු යම් සම්මතයකට අනුකූලවන තත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය සියළු උපකාර සහ දිරිදීමක් කිරීම ද කළ යුතුය. සඟරාවක් හෝ කතුවරයෙක් ලෙස පළමුවන ලෝකයට ඇතුළුවීම දුෂ්කර වෙයි. මෙම දුෂ්කරතාවය වත්මන් පරිගණක ක්‍රම මගින් මග හරවා ගත හැක. අන්තර් ජාලය සහ ලෝ වටා වෙබ් අඩවි මගින් තම වැඩ ප්‍රකාශයට ලක් කර එය වැදගත් නම් ක්ෂණික අවධානය ලබා ගත හැක.

විද්යුත් මාධ්‍ය පළ කිරීම් සහ මුද්‍රිත මාධ්‍ය පළ කිරීම් එකිනෙකට යාබදව විද්‍යාමාන විය හැක. එකිනෙකාට තමා සතු කුසළතා තිබේ. **Nature** නම් සඟරාවේ මෑතකදී වාර්තාවක් පළ විය. තරුණ නිපැයුම් කරුවන්ගේ සඟරාව පිළිබඳව එම වාර්තාව විය. මෙම සඟරාව ජාත්‍යන්තර වෙබ් අඩවි සඟරාවකි. එය අවධානය යොමු කර තිබුණේ තරුණ විද්‍යාඥයින්ට, තමා උපාධි අපේක්ෂකයෙක්ව සිටි කාලයේ කළ පර්යේෂණ ව්‍යාපෘති පළ කරන ලෙසයි. "පර්යේෂකයින්ට සඟරා සංස්කාරකවරුන්ට සහ හෙට විද්‍යා ලේඛකයින්ට" කදිම අත්දැකීමක් මෙමගින් ලැබීමට ඉඩ ඇත්තේ වයි.

ක්ෂේත්‍රය සහ පළ කරන ලද සඟරාව අනුව විද්‍යාත්මක පත්‍රයක් සතු ආවේනික හැඩයක් සහ ව්‍යුහයක් ඇත. ජීව විද්‍යා ක්ෂේත්‍රය ගැන සලකා බලන විට පහත සඳහන් ලෙස එය කෙටියෙන් සඳහන් කළ හැක. මාතෘකාව, කර්තෘගේ නම, සාරාංශය, හැඳින්වීම, ද්‍රව්‍ය සහ කරන ක්‍රම, ප්‍රතිඵල, සාකච්ඡාව සහ සොයා ගැනීම් පිළිබඳ කෙටි සම්පිණ්ඩනයක්, අනතුරුව ස්තුති කිරීම, ආශ්‍රිත ලිපි සහ පොතපත ගැන සඳහන් කිරීමද කළ යුතුය.

විද්‍යාත්මක උත්සාහයක මදය හෙවත් වැදගත්ම හරය රැඳී ඇත්තේ ලිඛිත සහ පළ කරන ලද දේ මතය. විද්‍යාත්මක ප්‍රගතියට මෙය බලවත් අභියෝගයක් වෙයි. එනම් පසුගිය වසර 10-15 තුළදී විද්‍යාත්මක ක්ෂේත්‍රයේ සිදුවූ, මහත් ප්‍රසිද්ධියක් ලබා දුන් අශෝභන හැසිරීම් හෝ වංචා සිදුවීම් ගැනයි. විද්‍යාත්මක ක්ෂේත්‍රයේ සිදුවන වැරදි ක්‍රියා පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීම මෙම කෙටි ලිපියේ විෂය පථයෙන් පිටය. එහෙත් එය කෙටියෙන් සඳහන් කරන්නේ නම් තමා විසින් පළ කරන දේ ගැන විද්‍යාඥයින් සත්‍ය හෝ අවංක විය යුතු බව අවධාරණය කළ යුතුය. එය කළ යුත්තේ ඉහත සඳහන් විද්‍යාත්මක පත්‍රයක් ලිවීමේදී අනුගමනය කළ යුතු සාරධර්ම අනුගමනය කර තමා විසින් සොයා ගත් දේ නිවැරදිව ඉදිරිපත් කිරීමෙනි. මේවා කිරීමට අසමත්වීම වංක ක්‍රියාවකට අවශ්‍ය දේ කිරීමක් වන අතර, එය දඬුවම් ලැබිය යුතු වරදක් වෙයි. එය විද්‍යාවේ උන්නතියට කැළලක් සහ බාධකයක් වෙයි.

සියළුම විද්‍යාඥයෝ සඟරාවක් කියවීමෙන් යම් තෘප්තියක් ලැබිය යුත්තාහ. තමන්ගේ සහ තම සහෝදර විද්‍යාඥයින්ගේ ප්‍රගතිය සහ ජයග්‍රහණ දැක සතුටු විය යුත්තෝය. අනාගතයේ දී කුමන හෝ හැඩයක් ගත්තේ වී නමුත් විද්‍යාත්මක සඟරාවල අඛණ්ඩ වර්ධනයක්, ප්‍රයෝජනයක් සහ ශුභ පැවැත්මක් අප විසින් ප්‍රාර්ථනා කළ යුතුය.

# ජාතික විද්‍යා පදනමේ "සෙව්වල" රූපවාහිනී සඟරාව

ජාතික විද්‍යා පදනම දීර්ඝ කාලයක සිට ජනතාව අතර විද්‍යාව ජනප්‍රිය කිරීමේ කාර්යයෙහි නියැලී සිටී. විශේෂයෙන් පාසැල් පදනම් වූ විද්‍යාත්මක වැඩසටහන් යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල දේශන, ප්‍රදර්ශන සහ වැඩමුළු සංවිධානය කර ඇත. විද්‍යා අධ්‍යාපන තේමාව යටතේ පොත් ගණනාවක් ජාතික විද්‍යා පදනම මගින් පළ කර ඇත. වසරකට දෙවරක් **"විදුරාව"** භාෂා තුනෙන්ම පළ කරන අතර, එය ඉලක්ක කර ගන්නේ සාමාන්‍ය ජනතාව සහ පාසැල් ළමුන්ය.

මෙම විධික්‍රම මගින් ආවරණය කෙරෙන්නේ ජනගහනයෙන් සීමා සහිත කොටසක් පමණි. මේ නිසා ජාතික විද්‍යා පදනම මගින් රූපවාහිනිය ඔස්සේ ජනතාව අතරට විද්‍යාව ගෙන යාමට විශේෂ වැඩපිළිවෙලක් සැලසුම් කර ඇත. ජාතික විද්‍යා පදනම කලින් අනුගමනය කළ ක්‍රම වලට වඩා මෙම ක්‍රමය වැඩි ආවරණයක් ලබා දෙන බව කිව යුතුය. මෙම වැඩසටහන හඳුන්වා දී ඇත්තේ '**NSF Science Magazine**' (ඉංග්‍රීසියෙන්), **"සෙව්වල"** (සිංහලෙන්), සහ **විඥ්ඥනතේඩල්** (දෙමලෙන්) යනුවෙනි.

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ, විද්‍යාව හා තාක්ෂණය මෑතකදී ලද වර්ධනය පිළිබඳව ජාතියේ දරුවන් සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමත් මෙම දැනුම ජීවිතයේ හැකියාවන් වර්ධනය කර ගැනීමට සහ ඔවුන්ගේ ජීවිතයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම පිණිස යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කිරීමත්ය.

ජාතික විද්‍යා පදනමේ විද්‍යා වැඩසටහන සිංහල, දෙමල සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම විකාශය කරනු ලබන අතර, එමගින් ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට අදාල පණිවිඩය ගෙන යෑමට බලාපොරොත්තු වෙයි.

ජාතික විද්‍යා පදනමේ විද්‍යා සඟරාව දියත් කරනු ලබන්නේ සතිපතා විකාශය වන රූපවාහිනී වැඩසටහනක් ලෙසටය. වසරකට වැඩසටහන් ගණන 52 කි (එක් භාෂාවකින්). වැඩසටහනක කාලය මිනිත්තු 24 කි. (සේවාදායකයන්ගේ වෙළඳ දැන්වීම්ද ඇතුලත්ව මුළු කාලය මිනිත්තු 30 කි).

මෙම වැඩසටහනේ විශේෂිත ඉලක්ක ඇත.

1. තෝරා ගත් සහ කාලෝචිත විද්‍යාත්මක කරුණු පිළිබඳව ළමුන් සහ පවුල් දැනුවත් කිරීම.
2. එම විෂය පිළිබඳ දිවයිනේ සහ ලෝකයේ සෙසු රටවල කරමින් පවත්නා විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳව ළමුන් සහ පවුල් නිරාවරණය කිරීම.
3. එම වැඩසටහන් වල අන්තර්ගත කරුණු උපයෝගී කර ගනිමින් ළමයින්ට, ඔවුන්ගේ පවුල් වලට සහ සාමාන්‍ය මහජනයාට, තමුන්ගේ පරිසරය සහ සෞඛ්‍යයනාදිය වැඩිදියුණු කිරීමට හැකියාවක් ලබා දීම සහ එමගින් රටේ මහජනතාවගේ ජීවිතය කෙරෙහි ධනවාදී බලපෑමක් ඇති කරවීම.
4. ළමයින් තුළ ඇති ජීවන කුසලතා වර්ධනය කර එමගින් ඔවුන් වත්මන් සමාජයේ වගකිව යුතු පුරවැසියන් බවට පත් කිරීම.
5. ළමයින් තුළ ඇති විද්‍යාව සහ තාක්ෂණයට මෙන්ම විද්‍යාත්මක සොයා ගැනීම් වලට ඇති ලැදිකම වර්ධනය කර, දැනට ක්‍රියාකාරී විද්‍යාඥයන්ගේ උනන්දුව ඔවුන් තුළ ඇති කරවීම.
6. නරඹන්නන් සමග, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව පුළුල් සංවාදයක් ඇති කිරීම.

ජාතික විද්‍යා පදනමේ **"විද්‍යා සන්නිවේදනය පිළිබඳ විශේෂ කමිටුව"** සෙව්වල රූපවාහිනී සඟරාව සඳහා වූ වැඩසටහන් වලට අදල මාතෘකාව තෝරා ගැනීම, එය සංවිධානය කිරීම, නිපදවීම සහ ගුණාත්මක වැඩසටහන් රූපවාහිනිය ඔස්සේ විකාශනය කිරීමේ වගකීම දරනු ලබයි. වැඩසටහන් සඳහා මාතෘකා තෝරාගනු ලබන්නේ, මහජනතාවට මුහුණපෑමට සිදුව ඇති වත්මන් අවශ්‍යතාවයන් සහ ගැටළු පිළිබඳ මාතෘකා පදනම් කරගෙනය. මෙහි වැදගත්කම වන්නේ එම අවශ්‍යතාවන් පසුබිමෙහි ඇති විද්‍යාත්මක මූලධර්ම සහ ක්‍රම මෙම වැඩසටහන් මගින් හුවා දැක්වීමයි.

මෙම රූපවාහිනී වැඩසටහන් නිපදවීමට සහ විකාශය කිරීමට, එක වසරක කාල පරිච්ඡේදයක් තුළ ජාතික විද්‍යා පදනමට විශාල මුදල් සම්භාරයක් වැය කිරීමට සිදු වෙයි. **එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)** සහ ජාතික විද්‍යා පදනම එක්බද්ධව මෙම වැඩසටහන් නිපදවීම පිළිබඳව කටයුතු කරගෙන යනු ලබයි. පහත සඳහන් වැඩසටහන් UNICEF අරමුදල් වලින් දැනටමත් ආරම්භ කර ඇත.

1. "බලශක්ති අර්බුධය අවසන් ද?" (පිටපත : ආචාර්ය තිලක් සියඹලාපිටිය)
2. "ජෛව විවිධත්වය කෙරෙහි මිනිසාගේ බලපෑම" (පිටපත: ආචාර්ය ජයන්ත වත්තෙවිදනගේ)
3. "ජෛව විද්‍යාත්මක නයිට්‍රජන තිර කිරීම" (පිටපත: මහාචාර්ය එස්.ඒ. කුලසූරිය)
4. "මාර්ග අනතුරු සහ වාහන තදබදය කළමනාකරණය" (පිටපත: මහාචාර්ය අමල් කුමාරගේ)
5. "ඒඩ්ස් වළක්වා ගත හැක" (පිටපත: ආචාර්ය වයි.සී.එච්. යකඳවල)

එක් එක් ක්ෂේත්‍රවල විද්‍යාඥයින් තාක්ෂණිකඥයින් සහ වෘත්තිකයින් විසින් පිටපත් සකස් කරනු ලැබේ. මෙම පිටපතේ සැකසුම, ද්‍රව්‍ය

සහ අන්තර්ගත කරුණු සහ නිපදවීම ගැන ජාතික විද්‍යා පදනමේ සන්නිවේදන කමිටුව වැඩි අවධානයක් යොමු කරයි. මෙයට හේතුව වන්නේ, නිරවද්‍යතාවය සහ තේරුම් ගැනීමට ඇති පහසුකම සහිත උසස් තත්වයේ වැඩසටහන් නිපදවීමට ඇති දැඩි අවශ්‍යතාවයයි. දේශීය අවශ්‍යතාවයන්ට අවධානය යොමු කරන, දේශීය වශයෙන් නිපදවනු ලබන **"සෙව්ල්ල"** හා සමාන රූපවාහිනියෙන් විකාශය වන වෙනත් වැඩසටහනක් දැනට නැත. නරඹන්නන්ගේ ප්‍රතිචාරය දැන ගැනීම සඳහා සෑම වැඩසටහනක් අවසානයේ දීම අඟනු ලබන ප්‍රශ්න මාලාවට ලිඛිත පිලිතුරු බලාපොරොත්තු වෙයි. ජයග්‍රාහකයින්ට තෑගි පිරිනැමේ.

**"සෙව්ල්ල"** රූපවාහිනී සගරාවේ විද්‍යා සගරාවේ අවසාන ඉලක්කය වන්නේ එළදයී පුරවැසියන් අප රටට දයාද කිරීමයි.

VIDUS 21-1-20

# යුනෙස්කෝ සාමය සහ සංවර්ධනය සඳහා වූ ජගත් විද්‍යා දිනය - සම්මන්ත්‍රණය සහ පුවත් පත් සාකච්ඡාව

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යා සහ සංස්කෘතික කටයුතු පිළිබඳ සංවිධානය (යුනෙස්කෝ) එහි 21 වෙනි සභාවාරයේ දී සෑම වසරකම **නොවැම්බර් 10 වෙනි දින සාමය සහ සංවර්ධනය සඳහා වූ ජගත් විද්‍යා දිනය** ලෙසට ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම දිනය ප්‍රකාශයට පත් කිරීමේ පරමාර්ථය වන්නේ සාමය සහ සංවර්ධනය සඳහා විද්‍යාව යොදා ගැනීමේ ජාතික සහ අන්තර් ජාතික කැපවීම පිළිබඳව උත්සාහයට පුනර්ජීවයක් ලබා දීම සහ සමාජයේ යහපත සඳහා විද්‍යාව වගකීමක් සහිතව යොදා ගැනීම පිළිබඳ අවධාරණය කිරීමටය.

ජාතික විද්‍යා පදනම මගින් මෙම දිනය සැමරීම පිණිස **2002 නොවැම්බර් 09 දින** බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ කමිටු ශාලාවන්හිදී සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. සම්මන්ත්‍රණයේ මාතෘකාව වූයේ **"සාමය සහ සංවර්ධනය සඳහා විද්‍යාව"** යන්නය. මීට අමතරව ජාතික විද්‍යා පදනම මගින් ආරම්භ කරන ලද විද්‍යා සන්නිවේදන වැඩසටහන වන **"සෙව්ල්ල"** රූපවාහිනී සඟරාව පිළිබඳ පුවත්පත් සාකච්ඡාවක් ද මෙදින පවත්වනු ලැබීය.

ජගත් විද්‍යා දිනයේ ඉලක්කය නම් එදිනෙදා ජීවිතයේදී විද්‍යාව යොදා ගැනීමේ වැදගත්කම පිළිබඳ මහජනතාව විශේෂයෙන්ම තරුණ කොටස් උනන්දු කරවීමයි. මෙම ඉලක්කගත කාරණය, නොබෝදා පිහිටුවනු ලැබූ **ජාතික විද්‍යා පදනමේ විද්‍යා සන්නිවේදනය පිළිබඳ විශේෂ කමිටුවේද** අරමුණු සමග අනුකූලවේ. මෙම කමිටුව පිහිටවනු ලැබුවේ සාමාන්‍ය ජනතාව අතර (විශේෂයෙන් රූපවාහිනී සඟරාවක් මගින්) විද්‍යාව ජනප්‍රිය කරවීම අරමුණු කරගෙනය.

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපනික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස ආරාධනා ලැබ මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය. යුනෙස්කෝව සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිසමේ මහලේකම් මහින්ද අබේවර්ධන මහතා විසින් පිළිගැනීමේ කතාව පවත්වන ලදී.

**"චිරස්ථායි සංවර්ධනය සඳහා විද්‍යාව"** සහ **"සාම ක්‍රියාවලියේ අත්හදා බැලීම් සහ දේශ පිළිබඳ ක්‍රමවේදය"** යන්නෙන් විශේෂ දේශන දෙකක් පිළිවෙලින් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ සභාපති, **ආචාර්ය ජනක රත්නසිරි මහතා** සහ ජාතික සාම සභාවේ මාධ්‍ය අධ්‍යක්ෂ, **ආචාර්ය ජෙහාන් පෙරේරා** විසින් පවත්වනු ලැබීය. මෙහිදී ජාතික විද්‍යා පදනමේ ආරාධනා ලැබ විවිධ ආයතන නියෝජනය කරමින් සහ ලංකාවේ විවිධ පළාත් වලින් මෙම සම්මන්ත්‍රණයට සහබාගි වූවෝ, මෙම දේශන අවසානයේදී පැවැත්වුණු විශේෂ සාකච්ජා වලට උනන්දුවෙන් සහභාගි වූහ.

**"සෙව්ල්ල"** රූපවාහිනී සඟරාව පිළිබඳව පැවැත්වූ පුවත්පත් සාකච්ජාව මෙම දිනයේ අවසාන අංගය ලෙස පැවැත්වුණි. මෙම පුවත්පත් සාකච්ජාව ඇරඹීමට ප්‍රථමයෙන් **"සෙව්ල්ල"** සඟරාව සඳහා නිෂ්පාදිත වැඩසටහන් දෙකක් වූ, ආචාර්ය තිලක් සියඹලාපිටිය විසින් ලියන ලද **"බලශක්ති අර්බුදය අවසානද?"** සහ ආචාර්ය ජයන්ත වත්තේවිදානගේ විසින් පිටපත රචනා කරන ලද **"ජෛව විවිධත්වය කෙරේ මිනිසාගේ බලපෑම"** යන වීඩියෝපට නැරඹීමට සලස්වන ලදී. ජාතික විද්‍යා පදනමේ සභාපති **මහාචාර්ය රන්ජන් රාමසාමි**, යුනෙස්කෝව සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිසමේ මහ ලේකම් **මහින්ද අබේවර්ධන**, ජාතික විද්‍යා පදනමේ සන්නිවේදන විශේෂ කමිටුවේ සභාපති **මහාචාර්ය එම්.ටී.එම්. ජිෆ්රි**, **ආචාර්ය ජයන්ත වත්තේවිදානගේ** සහ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ වැඩසටහන් නිෂ්පාදනය පිළිබඳව ("සෙව්ල්ල" සඟරාව පිළිබඳව) සම්බන්ධීකාරක **ආචාර්ය ගයත්‍රී ජයතිලක** යන මහත්ම මහත්මීන් මෙම පුවත්පත් සාකච්ජාව සඳහා සහභාගි වූහ. ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ, **එම්. වොට්සන්** මහතා මාධ්‍යවේදීන් සඳහාවූ සම්මන්ත්‍රණයට සහභාගි වූ සියලු දෙනාට ජාතික විද්‍යා පදනම වෙනුවෙන් සිය කෘතඥතාවය පුද කළේය.